# මුදල් කොමිෂන් සභාව

## අතිගරු ජනාධිපතිතුමා වෙත කෙරෙන නිර්දේශ - 2014

## (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) වගන්තියට අනුව)

**2014 මැයි**

දුරකථන:
தொலைபேசி
Telephone:

සභාපති
தலைவர்
Chairman: (+94) 011 2556840

ලේකම්
செயலாளர்:
Secretary: (+94) 011 2556831

කාර්යාලය
காரியாலயம்
Office: (+94) 011 2556834
011 3071324

ෆැක්ස්:
தொ.நகல்
Fax (+94) 011 2556836
011 2556837

විද්‍යුත් තැපැල
மின்னஞ்சல்:
e-mail fincom@sltnet.lk

# මුදල් කොමිෂන් සභාව

( ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154'ජ' ව්‍යවස්ථාව
යටතේ පිහිටුවන ලදී.)

# நிதி ஆணைக்குழு

(அரசியலமைப்பின் 154`ள
ஆம்உறுப்புரையின்கீழ் தாபிக்கப்பட்டது)

**FINANCE COMMISSION**
**(Established under Article 154 R of the Constitution)**

48, වජිර පාර,
කොළඹ 04.

48,வஜிரா வீதி,
கொழும்பு-04,இலங்கை.

48,Vajira Road,
Colombo 04, Sri Lanka.

මගේ අංකය
எனது இல:
My No FC/3/1/2014

ඔබේ අංකය
உமது இல:
Your No

දිනය
திகதி:
Date 20.05.2014

අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 01

අතිගරු ජනාධිපතිතුමනි,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය තුළ දැක්වෙන කියමන් පරිදි 2014 වර්ෂය සඳහා නිර්දේශය මේ සමඟ ඉදිරිපත් කරමි. රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම සඳහා යෝජිත උපාය මාර්ග හා පළාත්වල උපයෝජනය සඳහා වාර්ෂික අයවැයෙන් වෙන් කරන ලද අරමුදල් බෙදා හැරිය යුතු ආකාරය ද මෙයට අන්තර්ගත වේ.

මෙම නිර්දේශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (7) වගන්තියට අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වේ.

ඔබගේ විශ්වාසී,

ආරියරත්න හේවගේ
සභාපති

පටුන

1. මුදල් කොමිෂන් සභාවේ කාර්යය හා වගකීම ....... 2

1.1 බලය බෙදාහැරීමේ නීතිමය පදනම ....... 2

1.1.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද දහතුන්වන සංශෝධනය ....... 3

1.1.2. 1987 අංක 42 දරන පළාත් සභා පනත ....... 3

1.1.3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහඅට වන සංශෝධනය ....... 3

1.1.4. පළාත් ප්‍රඥප්ති සහ මුදල් රෙගුලාසි ....... 4

1.1.5. පළාත් පාලන ආයතන සඳහා නීතිමය පදනම ....... 4

2. රජයේ අරමුදල් පළාත්වලට මාරු කිරීම ....... 6

2.1 සාමූහික ප්‍රදාන ....... 6

2.2 උපමාන පාදක ප්‍රදාන ....... 6

2.3 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ....... 7

3. පළාත් අතර සම්පත් බෙදා වෙන් කිරීම සඳහා යොදා ගනු ලැබූ උපමාන ....... 8

3.1 සම්පත් බෙදා වෙන් කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදය ....... 8

4. පළාත් ආදායම ....... 11

4.1 ජාතික මට්ටමෙන් එකතු කරන ලද ආදායම පළාත්වලට මාරුකිරීම ....... 11

4.2 බලය පවරන ලද මූලාශ්‍රවලින් එකතු කරන ලද ආදායම ....... 12

4.3 පළාත් ආදායම් ඉලක්ක සැකසීම ....... 13

4.4 2014 වර්ෂය සඳහා ආදායම් පුරෝකථනය ....... 14

5. පළාත් සඳහා අරමුදල් තක්සේරු කිරීම හා බෙදා වෙන් කිරීම - 2014 ....... 16

5.1 පළාත් ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතා ඉල්ලුම් කිරීම ....... 16

5.2 පළාත් අවශ්‍යතා තක්සේරු කිරීම ....... 18

5.3 පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීම ....... 21

5.4 සැලසුම්කරණය හා පළාත් සැලසුම් අනුමත කිරීමේ ක්‍රමවේදය ....... 22

5.5 පළාත් පාලන ආයතන මූල්‍යනය ....... 23

6. ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය සමඟ අනුගත වීම ....... 25

6.1 සෑම පුරවැසියෙකුගේම අවම ජීවන මට්ටම සහතික කරලන පරිදි ප්‍රාදේශීය විෂමතා අවම කිරීම ................25

6.2 ග්‍රාමීය ප්‍රජාවට වැඩි ආදායම් උත්පාදන අවස්ථා නිර්මාණය කිරීම ............................................................26

6.3 තිරසාර සංවර්ධනයක් සඳහා පළාත් හා ග්‍රාමීය මාර්ග සංවර්ධනය...........................................................26

6.4 පළාත් සභා සඳහා නව හා විකල්පමය ආදායම් මාර්ග ..................................................................................27

6.5 පළාත් මට්ටමේ ආදායම් පදනම පුළුල් කිරීම..............................................................................................28

6.6 ආයතනික ප්‍රතිඵල රාමු ප්‍රවේශය අනුගමනය කිරීම......................................................................................29

6.7 සඵලදායී අධීක්ෂණ හා මෙහෙයුම් ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම.............................................................30

6.8 ආයතනික කාර්යභාරය හා වැඩ පරිමාව මත පදනම් වූ පළාත් කාර්ය මණ්ඩලය .........................................30

7. නිගමනය ..........................................................................................................................................................31

## වගු ලැයිස්තුව

වගුව 1: අරමුදල් වෙන් කිරීම සඳහා භාවිතයට ගනු ලැබූ සංයෝජිත දර්ශක - 2014 ....................................... 9

වගුව 2: රාජ්‍ය ආදායම මාරු කිරීම – 2012 සහ 2013 ................................................................. 12

වගුව 3: මූලාශ්‍ර අනුව එකතු කරන ලද පළාත් ආදායම (ජූනි දක්වා) - 2013 ................................................ 13

වගුව 4: 2014 වර්ෂය සඳහා ආදායම් පුරෝකථන ................................................................. 14

වගුව 5: 2014 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ ............ 15

වගුව 6: පළාත්වලට මාරු කිරීමට ඇස්තමේන්තුගත කරන ලද රජයේ ආදායම – 2014 .............................. 15

වගුව 7: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ පළාත් ඉල්ලීම් - 2014 .............. 17

වගුව 8: පුනරාවර්තන වියදම්වලට අදාලව පළාත් විසින් කරන ලද ඉල්ලීම් – 2014 (පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම්, මුද්දර බදු හා උසාවි දඩ ඇතුළත්ව) .................................. 18

වගුව 9: අනෙකුත් පුනරාවර්තන වියදම්වලට අදාලව පළාත් විසින් කරන ලද ඉල්ලීම් – 2014 (පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම්, මුද්දර බදු හා උසාවි දඩ හැර) .......................................... 19

වගුව 10: මුදල් කොමිෂන් සභාව විසින් තක්සේරු කරන ලද ප්‍රාග්ධන අවශ්‍යතා - 2014 ............................. 19

වගුව 11: පළාත් තත්‍ය කාර්යමණ්ඩල සඳහා තක්සේරු කරන ලද පුද්ගල පඩිනඩි – 2014 .......................... 20

වගුව 12: පළාත් සඳහා තක්සේරු කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම් - 2014 (මුද්දර බදු හා උසාවි දඩ නොමැතිව) ......................................................................................................... 21

වගුව 13: ප්‍රාග්ධන අරමුදල් බෙදා වෙන් කිරීම – 2014 ............................................................ 22

වගුව 14: සාමූහික ප්‍රදාන බෙදා වෙන් කිරීම – 2014 .................................................................. 23

වගුව 15: පළාත් පාලන ආයතනවල සේවක වැටුප් හා සභිකයින්ගේ දීමනා ගෙවීම සඳහා මුදල් වෙන් කිරීම් – 2014 ......................................................................................................... 24

## ඇමුණුම් ලැයිස්තුව

ඇමුණුම 1: සාමූහික ප්‍රදාන වෙන් කිරීම සහ නිදහස් කිරීම 2009 – 2013 ……………………….........…i

ඇමුණුම 2: උපමාන පාදක ප්‍රදාන වෙන් කිරීම සහ නිදහස් කිරීම 2009 – 2013………………..........… i

ඇමුණුම 3: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් කිරීම සහ නිදහස් කිරීම 2009 – 2013…..........…ii

# පූර්විකාව

රට තුළ පරිපාලන ක්ෂේත්‍රයෙහි ඓතිහාසික සිදුවීමක් සනිටුහන් වන අවස්ථාවක අතිගරු ජනාධිපතිතුමා වෙත 2014 වර්ෂය සඳහා නිර්දේශ ඉදිරිපත් කෙරෙනු ඇත. 1987 වර්ෂයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 13 වන සංශෝධනය මඟින් ද පළාත් සභාවලට සමහර බලතල ව්‍යවස්ථානුකූලව පවරා දුන්නේ වුවද, 2013 වර්ෂය වනතුරු සියලුම පළාත් සභා ස්ථාපිත කර නොතිබුණි.

ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍ය සංකල්පය තුළ ජාතික රජය මඟින් පාලනය කරන ලද අතර, උප ජාතික මට්ටමේ විවිධ ආයතන විසින් පවරා දෙන ලද බලතල ක්‍රියාත්මක කරන ලදී. 1987 වර්ෂයේ දී බලය බෙදා හැරීමේ සංකල්පය යටතේ පළාත් සභි පිහිටුවීම සිදුකරන තෙක් පරිධිය කරා බලය විමධ්‍යගත කරනු වස් ක්‍රියාමාර්ග කිහිපයක් අනුගමනය කරන ලදී. බලය බෙදා හැරීම තුළින් මූලික වශයෙන් අපේක්ෂා කරනු ලැබූයේ පළාත්වල වෙසෙන ප්‍රජාවට විශාල ප්‍රමාණයේ දේශපාලන නියෝජනයක් ලබාදීමයි. බලය බෙදා හැරීම පිළිබඳ ව්‍යවස්ථානුකූල ප්‍රතිපාදන පැවතියේ වුවද, තිස් වසරක් තුළ රට තුළ පැවති ගැටුම්කාරී තත්ත්වය නිසා උතුරු හා නැගෙනහිර පළාත් සභා නිල වශයෙන් පිහිටුවීමට නොහැකි විය.

2009 මැයි මාසයේ දී ත්‍රස්තවාදය මුලිනුපුට දමන ලද අතර, එතැන් පටන් රට තුළ ක්‍රමානුකූලව සාමාන්‍ය පරිසරය උදාවෙමින් පවතී. රජය විසින් රටෙහි කඩිනම් සංවර්ධන වැඩසටහනක් ආරම්භ කළ අතර, එමඟින් මූලික අවධානය යොමු වූයේ මහාමාර්ග, විදුලිබල සැපයුම හා නිවාස වැනි යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහිය. එසේම, හදිසි වැඩසටහනක් ලෙස සලකා උතුරු හා නැගෙනහිර පළාත්වල විශාල වශයෙන් අවතැන් වූ පිරිස් නැවත පදිංචි කිරීම සිදුකරන ලදී. 2008 වර්ෂයේ මැයි 16 වන දින නැගෙනහිර පළාත් සභාව පිහිටුවන ලද අතර, 2013 වර්ෂයේ ඔක්තෝබර් 07 වන දින උතුරු පළාත් සභාව ආරම්භ කරන ලදී. මෙලෙස උතුරු පළාත් සභාව පිහිටුවීමත් සමඟ මේ වන විට රට තුළ සියලුම පළාත් සභා ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම පළාත් සභා දෙක විසින් තමනට ව්‍යවස්ථානුකූලව පවරා දෙන ලද සෞඛ්‍ය, අධ්‍යාපන, කෘෂිකර්ම, වාරිමාර්ග සහ මහාමාර්ග වැනි විෂය ක්ෂේත්‍රයන් තුළ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා මහින්ද චින්තන දස අවුරුදු සංවර්ධන රාමුවෙන් හඳුනාගත් මහා පරිමාණ ව්‍යාපෘතිවලට සහාය දීම මඟින් ප්‍රදේශවාසීන්ගේ මූලික පහසුකම් වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. මෙම සංවර්ධන කාර්යයන් තුළින් පළාත්වල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට සහ රටෙහි දළ ජාතික නිෂ්පාදිතයට පළාත්වලින් සිදුවන දායකත්වය ඉහළ නැංවීමට හැකිවනු ඇත.

## 1. මුදල් කොමිෂන් සභාවේ කාර්යය හා වගකීම

1987 වර්ෂයේ දී ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද 13 වන සංශෝධනය මඟින් පළාත් සභා සහ මුදල් කොමිෂන් සභාව පිහිටුවීමට අවශ්‍ය විධිවිධාන සලස්වන ලදී. මෙම සංශෝධනයට අනුව සැලකිය යුතු බලතල ප්‍රමාණයක් ජාතික මට්ටමේ සිට පළාත් සභාවලට පවරන ලදී. පළාත් සභාව විසින් පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ දී, පළාත්වලට සම්පත් බෙදා හැරීම හා පළාත් සැලසුම් කරණ ක්‍රියාවලිය පහසුකරලීම පිණිස මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කෙරිණි.

13 වන ව්‍යවස්ථා සංශෝධනය තුළ මුදල් කොමිෂන් සභාවට පැවරෙන මූලික වගකීම් පැහැදිලිව දක්වා ඇත. ඒවා අතර, පළාත්වලට අරමුදල් බෙදා වෙන් කිරීමට අදාල මූලධර්මයන් පිළිබඳව රජයට නිර්දේශ සැපයීම හා රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති වන අයුරින් පළාත් නවය අතර සම්පත් වෙන් කරලීම ප්‍රධාන වේ. මුදල් කොමිෂන් සභාවේ බලතල පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) (5) හා (6) යන වගන්තිවල පැහැදිලිව සඳහන් කොට ඇත.

(i) පළාත් අවශ්‍යතා සපුරා ගැනීමේ අරමුණ ඉටු කරලීමෙහිලා ප්‍රමාණවත් වන පරිදි, මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය හා උපදෙස් මත පදනම්ව රජය විසින් වාර්ෂික අයවැයෙන් අරමුදල් සැපයිය යුතු වේ.

(ii) පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතු වේ.

(අ) රජය මඟින් වාර්ෂිකව පළාත් වෙත සපයනු ලබන අරමුදල් හා ඒවා පළාත් අතර බෙදා වෙන් කිරීමට අදාල වූ ප්‍රතිපත්ති.

(ආ) පළාත් මූල්‍යකරණය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලබන වෙනත් ඕනෑම කරුණක්.

(ඇ) රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සහතික කරලීමේ අරමුණ ඇතිව මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්ති සම්පාදනය සිදු කළ යුතු වේ. එහිදී එක් එක් පළාතට අයත් ජනගහනය, එක් එක් පළාතේ ඒකපුද්ගල ආදායම, සමාජ-ආර්ථික විෂමතාවන් වඩ වඩාත් අවම කරලීමේ අවශ්‍යතාවය සහ එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සම්බන්ධයෙන් පවත්නා වෙනස වඩාත් අවම කරලීමේ අවශ්‍යතාවය යන කරුණු සැලකිල්ලට ගත යුතුවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (7) වගනිත්යෙන් දැක්වෙන පරිදි මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන සෑම නිර්දේශයක්ම අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුතු අතර, ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග ද පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු වේ.

### 1.1 බලය බෙදාහැරීමේ නීතිමය පදනම

ශ්‍රී ලංකාව තුළ දේශපාලන හා පරිපාලන ව්‍යුහයනට අදාලව සැලකිය යුතු තරමින් බලය බෙදා හැරීම සඳහා හඳුන්වා දෙන ලද ක්‍රමවේදය ව්‍යවස්ථාමය කුළුණු ගණනාවක් මත පදනම් වේ. මෙම නීතිමය රාමුව පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

### 1.1.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද දහතුන්වන සංශෝධනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද 13 වන සංශෝධනය තුළින් පළාත් සභා ක්‍රමය සමඟ බැඳුණු බලය බෙදා හැරීමේ රාජ්‍ය යාන්ත්‍රණය තුළ පළාත් සභාවලට ව්‍යවස්ථාදායක, විධායක හා මූල්‍ය අධිකාරිත්වය භුක්ති විඳීමේ අවස්ථාව සැලසී තිබේ. දහතුන් වන සංශෝධනය මඟින් ජාතික රජය හා පළාත් සභා අතර බලය බෙදා හැරීමට අදාල වන ලැයිස්තු 03 ක් හඳුන්වාදී ඇත. එනම්, සංවෘත ලැයිස්තුව (ජාතික රජය සතු බලතල), පළාත් ලැයිස්තුව (පළාත්වලට පවරන ලද බලය) හා සමගාමී ලැයිස්තුව (වගකීම හවුලේ බෙදාගත් ක්ෂේත්‍ර) යනුවෙනි. මෙම සංශෝධනයත් සමඟ රට තුළ ස්ථර තුනකින් යුත් රාජ්‍ය පාලන තන්ත්‍රයක් බිහිවූ අතර, ඒවා ජාතික රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන ලෙස හඳුනාගත හැකිය. මේ එකිනෙක ස්තර අතර අන්‍යොන්‍ය රැඳියාවක් පවත්නා නමුදු ජාතික රජය විසින් අනෙකුත් ස්ථරයන් අභිබවා යන පරිදි ක්‍රියා කරනු ඇත.

දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් පහත දැක්වෙන අයුරින් ව්‍යවස්ථාමය පදනම සපයා ඇත.

(i) පළාත් සභා පිහිටුවීම
(ii) පළාත් සඳහා ආණ්ඩුකාරවරුන් පත්කිරීම
(iii) පළාත් සභාවල සාමාජිකත්වය හා නිල කාලය
(iv) ප්‍රධාන අමාත්‍යවරයා හා අමාත්‍ය මණ්ඩලය පත්කිරීම හා ඔවුනට අයත් බලතල
(v) පළාත් සභාවල ව්‍යවස්ථාදායක බලය
(vi) පරිපාලන යාන්ත්‍රණයෙහි බිඳවැටීමක් සිදුවූ අවස්ථාවක ගතහැකි විකල්පමය ක්‍රියාමාර්ග
(vii) පළාත් තුළ ඉහළ උපාධි පිහිටුවීම
(viii) මුදල් කොමිෂන් සභාව පිහිටුවීම

### 1.1.2. 1987 අංක 42 දරන පළාත් සභා පනත

පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන්, පළාත් සභා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, 1987 අංක 42 දරන පළාත් සභා පනත මඟින් විස්තරාත්මකව දක්වා ඇත.

(i) පළාත් සභාවල සාමාජිකත්වය
(ii) පළාත් සභා රැස්වීම් හා කටයුතු සිදුකරගෙන යාම
(iii) පළාත් සභාවල මූල්‍ය පරිපාටිය
(iv) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා පිහිටුවීම
(v) ප්‍රධාන ලේකම් හා අනෙකුත් නිලධාරීන් පත්කිරීම

### 1.1.3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහඅට වන සංශෝධනය

2010 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වාදෙන ලද දහඅට වන සංශෝධනය තුළින් කොමිෂන් සභා හතක් පත්කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දී ඇත. සංශෝධනයේ 41 ඒ (1) වගන්තිය යටතේ දැක්වෙන 1 වන උපලේඛනයෙහි සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරු හා සාමාජිකයින් අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලැබේ. මෙම පත්වීම් සිදුකිරීමේ දී, ජනාධිපතිතුමා විසින් එම වගන්තිය යටතේම පිහිටුවන ලද

පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ලබාගත යුතුය. ඉහත දක්වන ලද 1වන උපලේඛනයෙහි සඳහන් කොමිෂන් සභා හත අතුරින් මුදල් කොමිෂන් සභාව එකක් වේ.

### 1.1.4. පළාත් ප්‍රඥප්ති සහ මුදල් රෙගුලාසි

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන සංශෝධනයට අනුව, පළාත්වලට අදාල ප්‍රඥප්ති සැකසීමේ බලය එම පළාත්වලට පැවරී ඇත. සෑම පළාත් සභාවක්ම ස්වකීය ප්‍රඥප්තිවලට එකඟතාවය ලබැගැනීම සඳහා ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. ආණ්ඩුකාරවරයා විසින් මෙලෙස ඉදිරිපත් කරන ලද ප්‍රඥප්ති වලට එකඟතාවය ලබාදීම හෝ එසේ නොවන අවස්ථාවන්හිදී ඒවා යළි සලකා බැලීම සඳහා ආපසු පළාත් සභා වෙත යොමු කිරීම හෝ සිදුකරනු ඇත.

පළාත්වලට අදාලව සකසන ලද මුදල් රෙගුලාසි මුදල් කොමිෂන් සභාවේ සමස්ත සුපරීක්ෂණයට යටත් වන අතර, පළාත් සංවර්ධන සැලසුම් ක්‍රියාවලිය සඳහා කොමිෂන් සභාවේ සහාය ලබාගැනීමේ විධිවිධාන ඊට අනුකූල විය යුතුය. පළාත් මූල්‍ය රෙගුලාසිවල සඳහන් වන පරිදි මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

- පළාත්වල ප්‍රාග්ධන වියදම්, පුනරාවර්තන වියදම් සහ කාර්ය මණ්ඩල අවශ්‍යතාවයන් වාර්ෂිකව තක්සේරු කිරීම.
- පළාත්වල අවශ්‍යතාවයන් තක්සේරු කිරීමට අදාල මාර්ගෝපදේශ හා උපදෙස් නිකුත් කිරීම.
- පළාත් සමඟ සංවාදයක නිරත වීමෙන් අනතුරුව පළාත් සංවර්ධනය සඳහා අවශ්‍ය කරනු ලබන මූල්‍ය ප්‍රතිපාදන නිර්දේශ කිරීම.
- රජය විසින් වෙන් කරන ලද වාර්ෂික ප්‍රධාන පිළිබඳව පළාත්වලට දැනුම් දීම.
- රාජ්‍ය ප්‍රතිපත්තියම හා අයවැය රාමුවට අනුගත වෙමින් අරමුදල් උපයෝජනයට ගැනීම ඇතුළත්ව වාර්ෂික සංවර්ධන සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- ඵලදායී ලෙස සම්පත් උපයෝජනය කිරීම මඟින් තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සහතික කරලීම සඳහා පළාත් යොමු කිරීම.

### 1.1.5. පළාත් පාලන ආයතන සඳහා නීතිමය පදනම

රාජ්‍ය යාන්ත්‍රණයේ තුන්වන හෙවත් පහළම ස්ථරය සේ සැලකෙන පළාත් පාලන ආයතන විසින් මහජනතාව විවිධ වූ සේවාවන් සැපයීමේ වගකීම උසුලනු ලබයි. එකී සේවාවන් තුළට මාර්ග, සනීපාරක්ෂාව, කාණු පද්ධති, නිවාස, පුස්තකාල, පොදු උද්‍යාන හා විනෝදාත්මක පහසුකම් අයත් වේ.  සියලුම පළාත් පාලන ආයතන මහජන ඡන්දයෙන් තේරී පත්වූ සභිකයන්ගෙන් සමන්විත වේ.

පළාත් පාලන ආයතන නීතිමය පදනමකින් යුත් ආයතන තුනක් යටතේ ක්‍රියාත්මක වේ. ඒවා මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වශයෙන් වර්ග කෙරේ. වර්තමානයේ රට තුළ මහ නගර සභා 23 ක්, නගර සභා 41 ක් සහ ප්‍රාදේශීය සභා 271 ක් ක්‍රියාත්මක වේ.  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මඟින් පළාත් පාලනය, පළාත් සභාවලට බලය පවරන ලද විෂයයක් ලෙස හඳුනාගෙන ඇත. පළාත් පාලන ආයතනවලට අදාල නීති රෙගුලාසි යටතේ ස්වකීය මූල්‍යමය අවශ්‍යතාවයන් සපුරා ගැනීම උදෙසා පළාත් පාලන අරමුදල්

පිහිටුවා ගැනීම සඳහා අවශ්‍ය බලතල පැවරී ඇත. ඒ අනුව, මහ නගර සභා අරමුදල, නගර සභා අරමුදල හා ප්‍රාදේශීය සභා අරමුදල යනුවෙන් වූ අරමුදල් පිහිටුවා ගෙන තිබේ.

## 2. රජයේ අරමුදල් පළාත්වලට මාරු කිරීම

මුදල් කොමිෂන් සභාවේ උපදෙස් මත පළාත්වල මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් අරමුදල් රජය විසින් සපයාදිය යුතු බව ව්‍යවස්ථාවේ දහතුන් වන සංශෝධනය මඟින් අවධාරණය කෙරේ. රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සිදුවන පරිදි මෙම අරමුදල් පළාත් අතර බෙදා හැරීම මුදල් කොමිෂන් සභාවේ මූලික වගකීමක් වනු ඇත. මෙහිලා කොමිෂන් සභාවේ කාර්යභාරය ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ දැක්විය හැකිය.

(අ) පළාත් විසින් ඉදිරිපත් කරනු ලබන අවශ්‍යතා විශ්ලේෂණ පදනම් කොටගෙන අරමුදල් පිළිබඳව ඇස්තමේන්තුවකට එළඹීම සහ රජයේ ප්‍රතිපත්තිමය මහපෙන්වීම් හා ප්‍රමුඛතාවයකට අනුගතවීම සහතික කරලීම. මෙම අවශ්‍යතාවයනට සරිලන පරිදි අරමුදල් වෙන් කිරීම පිළිබඳව මුදල් කොමිෂන් සභාව විසින් රජයට දැනුම් දෙනු ඇත.

(ආ) ප්‍රාදේශීය විෂමතා අවම වන අයුරින් මෙකී අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම.

පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීමේ ක්‍රියාවලියේ දී පහත දැක්වෙන අරමුදල් ප්‍රදාන කොමිෂන් සභාව විසින් භාවිතයට ගනු ලැබේ.

### 2.1 සාමූහික ප්‍රදාන

සේවා සැපයීමේ ක්‍රියාදාමය වැඩිදියුණු කිරීම හා ඒවා නොනවත්වා පවත්වාගෙන යාම සඳහා පළාත්වලට දෙනු ලබන පුනරාවර්තන වියදම් සඳහා වූ අරමුදල් සාමූහික ප්‍රදාන ලෙස හැඳින්වේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද පළාත් කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතන සඳහා කරනු ලබන ගෙවීම් පුනරාවර්තන වියදම් වලින් අපේක්ෂිත ප්‍රධාන කාර්යය වේ. මෙම වැටුප් හා වේතන ගණනය කිරීමේ දී අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ සිටින තත්‍ය කාර්ය මණ්ඩලය සැලකිල්ලට ගනු ඇත. මෙම සාමූහික ප්‍රදාන තුළට පළාත් සභා ආයතනවලට අයත් සේවකයින්ගේ වැටුප් හා වේතන සහ සභිකයින්ගේ දීමනා ප්‍රතිපූරණය කිරීම සඳහා අවශ්‍ය වියදම් ද ඇතුළත් වේ. (2009 – 2013 කාලපරිච්ඡේදය තුළ සාමූහික ප්‍රදාන යටතේ නිර්දේශිත අරමුදල් ප්‍රමාණයන් සහා ඒවා මුදා හැර තිබෙන ආකාරය ඇමුණුම -1 මඟින් විස්තර කෙරේ).

### 2.2 උපමාන පාදක ප්‍රදාන

රට තුළ දක්නට ලැබෙන ප්‍රාදේශීය සංවර්ධන විෂමතාවන් අවම වන අයුරින් පළාත්වල වෙසෙන ජනතාවගේ සමාජ - ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස සපයනු ලබන ප්‍රාග්ධන දීමනා සාමූහික ප්‍රදාන ලෙස අර්ථ දැක්වේ. මෙම අරමුදල් පළාත්වල අභිමතය පරිදි සංවර්ධන කටයුතු සඳහා වැය කිරීමේ ඉඩප්‍රස්ථා ඔවුනට හිමිව ඇත. කෙසේ වුවද, මෙම අරමුදල් භාවිතයට ගැනීමේදී මුදල් කොමිෂන් සභා විසින් නිකුත් කර තිබෙන 2011 ජූලි 26 දිනැති මාර්ගෝපදේශ (FC/PSDG&CBG/CIRCULAR/2011/1) මෙහිදී අදාල කරගත යුතු වේ. මෙම මාර්ගෝපදේශ 2012 හා 2013 වර්ෂවලදී සංශෝධනවලට භාජනය කර ඇත. මෙම සංශෝධන මඟින් ලියාපදිංචි වූ ප්‍රජා සංවිධානවලට ප්‍රදානය කළ හැකි කොන්ත්‍රාත්වලට අදාල සීමාවන් ඉහළ නංවා ඇති අතර, ස්වයං - රැකියා වැඩි වශයෙන් ජනනය කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දී තිබේ. (2009 – 2013 කාලපරිච්ඡේදය

තුළ උපමාන පාදක ප්‍රදාන යටතේ වෙන් කරන ලද අරමුදල් හා ඒවා නිදහස් කිරීම් පිළිබඳව සංඛ්‍යාත්මක තොරතුරු ඇමුණුම - 2 මඟින් විස්තර කර ඇත).

### 2.3 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන

ප්‍රාග්ධන ස්වරූපයේ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යනය සඳහා මෙම ප්‍රදාන වෙන් කරනු ලැබේ. මහජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් බලය බෙදා හරින ලද විෂයයනට අදාල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් මෙහිදී අපේක්ෂා කෙරේ. මෙයට අදාල පළාත් සංවර්ධන සැලසුම් ඉදිරිපත් කිරීමේදී, එමඟින් පළාත් අවශ්‍යතාවයන් නිවැරදි ලෙස ආමන්ත්‍රණය වීම හා ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුගත වීම යන කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් ක්‍රියා කරන අතර, අධිකාරීන් සමඟ සංවාදයක නිරත වීමෙන් අනතුරුව ඒ පිළිබඳ එකඟත්වයකට එළඹෙනු ඇත. මෙම අරමුදල්වලට අදාල සැලසුම්වල මිණිය හැකි ප්‍රතිඵල (නිමැවුම, ප්‍රතිවිපාක හා ප්‍රතිඵල) ඇතුළත් කිරීම අනිවාර්ය වන අතර, ඒ සඳහා පූර්වයෙන් නිශ්චය කරන ලද දර්ශක හඳුනාගත යුතු වේ. මෙකී දර්ශක පදනම් කරගෙන අධීක්ෂණ හා අගැයීම් කාර්යය නිශ්චිත කාල රාමුවක් තුළදී සිදුකරනු ඇත. ප්‍රතිඵල පාදක කරගත් අධීක්ෂණ හා අගැයීම් ක්‍රමවේදය තුළ කොමිෂන් සභාව විසින් හඳුන්වාදෙන ලද ආදර්ශ ආකෘතිපත්‍ර සියලුම පළාත් විසින් භාවිතයට ගැනීම සිදු කළ යුතුය. (2009 – 2013 කාලපරිච්ඡේදය තුළ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් කරන ලද අරමුදල් හා ඒවා නිදහස් කිරීම් පිළිබඳව සංඛ්‍යාත්මක තොරතුරු ඇමුණුම - 3 මඟින් විස්තර කර ඇත).

- **තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වූ විශේෂ ව්‍යාපෘති**

ප්‍රාදේශීය විෂමතාවයකින් අවම කරලීමේ අරමුණින් පළාත් විසින් හඳුනාගන්නා ලද විශේෂ මධ්‍යකාලීන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මේ යටතේ විශේෂිත අරමුදල් ප්‍රමාණයක් වෙන් කෙරේ. වර්ෂ 1 – 3 ත් අතර කාල පරාසයක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව එකඟතාවය ලබාගත යුතු වේ. මෙම ව්‍යාපෘති මඟින් අදාල ප්‍රදේශයන්හි එකතු කළ වටිනාකම, දිළිඳු බව දුරලීම හා රැකියා ප්‍රවර්ධනය යන කරුණු විෂයෙහි ධනාත්මක බලපෑමක් සිදුකිරීම අපේක්ෂා කෙරේ.

- **පසුගාමී සහ හුදකලා ගම් සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘති**

අතවශ්‍ය මූලික යටිතල පහසුකම් සංවර්ධනය නොසලකා හැරීම නිසා පසුගාමී හා හුදකලාභාවයට පත්ව ඇති ග්‍රාමීය ප්‍රදේශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ වැඩසටහන්/ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස මෙම විශේෂිත අරමුදල් යටතේ ප්‍රතිපාදන වෙන් කෙරේ. මෙවැනි ගම්මානවල සංවර්ධනය සඳහා අවශ්‍ය සියලුම අංශයනට අයත් ක්‍රියාකාරකම් සැලකිල්ලට ගැනෙන ඒකාබද්ධ ප්‍රවේශයක් තුල මෙම වැඩසටහන්/ ව්‍යාපෘති සැලසුම් කළ යුතු වේ. මේ අනුව කුඩා පාලම්, බෝක්කු, ප්‍රවේශ මාර්ග, විදුලි බලය, පානීය ජලය, කෘෂිකාර්මික තාක්ෂණය කුඩා කර්මාන්තවලට පහසුකම් සැලසීම සහ තාක්ෂණික ඥාණය ප්‍රචලිත කිරීම වැනි ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා මෙකී අරමුදල් යෙදවීම සිදුකළ යුතුය.

## 3. පළාත් අතර සම්පත් බෙදා වෙන් කිරීම සඳහා යොදා ගනු ලැබූ උපමාන

රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කරලීම සඳහා වූ මූලධර්ම සැකසීමේ වගකීම පැවරී තිබෙනුයේ මුදල් කොමිෂන් සභාව වෙතය. මෙම අරමුණ මුල්කොට ගෙන, පළාතේ මුළු ජනගහනය, ඒක පුද්ගල ආදායම සහ පළාත් අතර පවත්නා සමාජ - ආර්ථික විෂමතාවයන් අඩුකරලීමේ අවශ්‍යතාවය යන ප්‍රධාන උපමාන කෙරෙහි අවධානය යොමු කරමින් කොමිෂන් සභාව විසින් පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීම සිදු කරනු ඇත.

පළාත් අතර දක්නට ලැබෙන සමාජ - ආර්ථික විෂමතාවයන් අඩුකරලීම සහතික කරනු වස් කොමිෂන් සභාව විසින් පුළුල් විමර්ශනයක නියැලෙනු ඇත. මෙම අභ්‍යාසයේදී පළාත් දල දේශීය නිෂ්පාදිතය, දරිද්‍රතා අනුපාතය, පළාත් ඒකපුද්ගල ආදායම, දල දේශීය නිෂ්පාදිතයේ පළාත් දායකත්වය, පළාත්වල ආර්ථික අංශයන්හි සාමාන්‍ය පංගුව, සාමාන්‍ය පළාත් වර්ධන අනුපාතය සහ එක් එක් පළාතේ ජනගහන පංගුව යන ප්‍රධාන සාර්ව දර්ශක භාවිතය ගනු ලැබේ.

### 3.1 සම්පත් බෙදා වෙන් කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදය

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන යටතේ පළාත්වලට අරමුදල් බෙදා වෙන් කිරීමේ දී කොමිෂන් සභාව විසින් ගණිතමය සූත්‍රයක් (Formula) භාවිතයට ගනු ලැබේ.

සියලුම පළාත් සඳහා සංයුක්ත දර්ශකයක් (Composite Index) සැකසීමේ දී "මූලික සංරචක විශ්ලේෂණය" (Principal Components Analysis) නමැති සංඛ්‍යානමය උපකරණය යොදාගෙන තිබේ. මෙය බහු විචල්‍යමය සංඛ්‍යාත ක්‍රමවේදයක් වන අතර, මහජනතාවගේ ජීවන මට්ටම කෙරෙහි සෘජුවම බලපානු ලබන විචල්‍යයන් කිහිපයක් මේ සඳහා තෝරාගනු ලැබේ. මෙම සම්පත් වෙන් කිරීමේ සූත්‍රය (Resource Allocation Formula) සඳහා යොදාගත් විචල්‍යයක් පහත දැක්වෙන කාණ්ඩ 04 ට අයත් වේ.

(i) ආදායම හා දරිද්‍රතාවය - මධ්‍යන්‍ය ඒක පුද්ගල ආදායම, දරිද්‍රතා දර්ශකය / අනුපාතය සහ සේවා වියුක්ති අනුපාතය - ප.නි.ස.ප්‍ර සඳහා බර තැබීම 40%

(ii) සෞඛ්‍ය පහසුකම් - ළදරු මරණ අනුපාතිකය සහ අඩු බර දරු උපත් - ප.නි.ස.ප්‍ර සඳහා බර තැබීම 15%

(iii) අධ්‍යාපන පහසුකම් - සිසුන් ඇතුළත් කරගැනීමේ අනුපාතය සහ ශ්‍රේණි 4, 5, 9, අ.පො.ස. (සා/පෙළ) හා අ.පො.ස. (උ/පෙළ) ඉගෙනුම් කාර්ය සාධනය - ප.නි.ස.ප්‍ර සඳහා බර තැබීම 15%

(iv) යටිතල පහසුකම් - විදුලි බලය නොමැති කුටුම්භ සංඛ්‍යාව සහ "සී" සහ "ඩී" මාර්ගවල දිග ප්‍රමාණය - ප.නි.ස.ප්‍ර සඳහා බර තැබීම 30%

මෙම කාණ්ඩ 04 සඳහා එක් එක් පළාතේ ජනගහන පංගුව මත බර තැබීමක් සිදු කරන ලදී. අදාල සංඛ්‍යානමය සූත්‍රය (සම්පත් වෙන් කිරීමේ සූත්‍රය) පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කළ හැකිය.

$$x_i = a_1 V_{1i} \bar{B} + a_2 V_{2i} \bar{B} + \ldots + a_n V_{ni} \bar{B}, \quad \sum_{i=1}^{n} ai = 1$$

Xi = i පළාත සඳහා වෙන් කරන ලද අරමුදල්

Vni = i පළාත සඳහා වූ අරමුදල් විචල්‍ය කාණ්ඩයේ ලකුණු

an = Vn විචල්‍ය කාණ්ඩලය සඳහා බර තැබීම

උපමාන පාදක ප්‍රදාන විෂයෙහි එක් එක් කාණ්ඩයට තබන ලද බර ජනගහනය-35%, ඒක පුද්ගල ආදායම-20%, දරිද්‍රතා අනුපාතය-20% සහ සේවා වියුක්ති අනුපාතය-25% වශයෙන් වේ.

2014 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදාන යටතේ පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීම පිණිස භාවිතයට ගනු ලැබූ සංයුක්ත දර්ශක පහත දැක්වෙන වගුව - 1 මඟින් විස්තර කර ඇත.

**වගුව 1: අරමුදල් වෙන් කිරීම සඳහා භාවිතයට ගනු ලැබූ සංයෝජිත දර්ශක - 2014**

| පළාත | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා සංයෝජිත දර්ශක ලකුණු | උපමාන පාදක ප්‍රදාන සඳහා සංයෝජිත දර්ශක ලකුණු |
|---|---|---|
| බස්නාහිර | 0.141776 | 0.215716 |
| දකුණ | 0.119078 | 0.120791 |
| සබරගමුව | 0.119396 | 0.105867 |
| මධ්‍යම | 0.125506 | 0.125938 |
| ඌව | 0.105193 | 0.083533 |
| නැගෙනහිර | 0.105971 | 0.091885 |
| වයඹ | 0.105490 | 0.110560 |
| උතුරු මැද | 0.085104 | 0.072859 |
| උතුර | 0.092487 | 0.072850 |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව 2011*

මෙම සංයුක්ත දර්ශක භාවිතයට ගනිමින්, මහා භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද අරමුදල් පළාත් අතර බෙදා වෙන් කරන ලදී. පළාත් නිශ්චිත සංවර්ධන හා උපමාන පාදක යන දෙවර්ගයටම අයත් අරමුදල් බෙදා වෙන් කිරීම් දී මෙම ක්‍රමවේදයට අනුගත විය. කෙසේ වුවද, එක් එක් පළාත තුළ ජාතික මට්ටමෙන් විදේශධාර හා දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සහ පළාත් විසින් උපයනු ලබන ආදායම්වල ප්‍රමාණය සැලකිල්ලට ගෙන ප්‍රායෝගික තත්ත්වයකට ගැලපෙන සේ කිසියම් සංශෝධනයක් ද මෙහිදී සිදු කරන ලදී.

පළාත් අතර ප්‍රාග්ධන අරමුදල් බෙදා හැරීමෙන් අනතුරුව එකී අරමුදල් අංශ හෝ ආයතන අතර බෙදා වෙන් කළ යුතුය. ඉන් පසු එක් එක් පළාතට අංශ/ ආයතන පදනම් කර ගත් සංවර්ධන සැලසුම් ඉදිරි මුදල් වර්ෂය සඳහා සකස් කළ හැකිය.

2014 වර්ෂය සඳහා අංශ හා ආයතන අතර ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීමේදී මුදල් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන කරුණු මත පදනම් වූ තාර්කික ප්‍රවේශයක් අනුගමනය කරන ලදී.

(i) රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවෙහි දැක්වෙන ප්‍රතිපත්තිමය මගපෙන්වීම් හා උපාය මාර්ගවලට අනුගත වීම.

(ii) පළාත් විසින් පිළියෙල කරන ලද මධ්‍ය කාලීන ආයතනික ප්‍රතිඵල රාමුවල හඳුනාගෙන තිබෙන අරමුණු හා ප්‍රමුඛ පරාස සමඟ ගැලපීම.

(iii) සෞඛ්‍ය, අධ්‍යාපන හා සමාජ සේවා වැනි ප්‍රධාන සමාජ - ආර්ථික අංශ විෂයෙහි දක්නට ලැබෙන පළාත් ඇතුළත විෂමතා.

(iv) ප්‍රධාන වශයෙන් ආදායම් උත්පාදන කාර්යයන් සඳහා පෞද්ගලික ආයෝජන ආකර්ශණය කරගත හැකිවන පරිදි පළාත්වල භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය.

(v) පළාත් ආර්ථිකයන් තුළ ඉදිරි හා පසු සම්බන්ධතා ඇති කරලීමට සමත් විශේෂයෙන් සැලසුම් කරන ලද ව්‍යාපෘතිවල අවශ්‍යතාවය.

(vi) පළාතේ අනෙකුත් ප්‍රදේශ සමඟ පවත්නා සම්බන්ධතා තීව්‍ර කිරීම් අපේක්ෂාවෙන් හුදකලා වූ භූගෝලීය ප්‍රදේශවල ඍජු ප්‍රතිඵල ජනිත කරලීමට සමත් අන්දමේ තෝරාගත් ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම.

පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් බලන විට විශේෂයෙන් අධ්‍යාපන හා සෞඛ්‍ය යන අංශවල මානව සම්පත් සංවර්ධනයෙහිලා විශාල කාර්ය සාධනයක් ඉටුවී ඇති බව පෙනී යයි. පුනරාවර්තන වියදම්වලින් විශාල ප්‍රමාණයක් වැය වනුයේ, සෞඛ්‍ය හා අධ්‍යාපන යන ක්ෂේත්‍රයනට අදාල සේවාවන් සැපයීම වෙනුවෙනි. රේඛීය අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් අංශවලට අයත් ව්‍යාපෘතිවල මානව සම්පත් අවශ්‍යතා ලබාදීම සඳහා ද පළාත් පුනරාවර්තන වියදම් දායකවන බව සඳහන් කළ යුතුය. මේ අනුව පැහැදිලි වනුයේ පළාත් පුනරාවර්තන වියදම් මඟින් පළාත් සංවර්ධන ආයෝජනවලට පමණක් නොව රේඛීය ආයතනවල සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ද දායකත්වයක් සපයනු ලබන බවයි.

## 4. පළාත් ආදායම

පළාත් ආදායම් ප්‍රධාන මූලාශ්‍ර දෙකකින් ජනිත වනු ඇත.

i. රජයේ ආදායම් මාරු කිරීම

ii. බලය පවරන ලද මූලාශ්‍රයන්ගෙන් එකතු කරන ලද ආදායම

### 4.1 ජාතික මට්ටමෙන් එකතු කරන ලද ආදායම පළාත්වලට මාරුකිරීම

රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව ව්‍යාපෘති පිරිවැටුම් බද්ද අහෝසි කරන ලද අතර, 2011 වර්ෂයේ පටන් බලපවත්වන පරිදි ජාතික වශයෙන් එකතු කරගත් ආදායම බෙදා ගැනීමේ වන ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදි. මේ අනුව අංක 01/2010 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ ප්‍රකාරව ජාතික මට්ටමේ අධිකාරීන්වන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් එකතු කරන ලද අදායම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් - 33 1/3% , මුද්දර ගාස්තු - 100% සහ රථවාහන ලියාපදිංචි කිරීමේ ගාස්තුවෙන් - 70% වශයෙන් පළාත්වලට  මාරු කළ යුතු වේ.

එකතු කරන ලද ජාතිය ගොඩනැගීමේ හා මුද්දර බදු, ඒ සඳහා විශේෂිත වූ බැංකු ගිණුම් හරහා සති දෙකකට වරක් පළාත්වලට මාරුකළ යුතුවේ. මෙහිදී මහා භාණ්ඩාගාරය හා මුදල් කොමිෂන් සභාව විසින් වරින් වර වෙනස් කිරීම්වලට ලක් කරනු ලබන පහත දැක්වෙන ප්‍රතිශතයන්/ අනුපාතයන් භාවිතයට ගැනේ.

| පළාත | අනුපාතය |
|---|---|
| බස්නාහිර | 48% |
| මධ්‍යම | 9% |
| දකුණ | 9% |
| වයඹ | 9% |
| සබරගමුව | 5% |
| උතුරු මැද | 5% |
| ඌව | 5% |
| නැගෙනහිර | 5% |
| උතුර | 5% |

වගුව 2: රාජ්‍ය ආදායම මාරු කිරීම – 2012 සහ 2013

*රු.මි.*

| පළාත | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ඉලක්ක | මාරු කිරීම් | ඉලක්ක | ජුනි දක්වා මාරු කිරීම් * |
| බස්නාහිර | 15,360 | 13,043 | 18,240 | 5,879 |
| මධ්‍යම | 2,880 | 2,458 | 3,420 | 1,090 |
| දකුණ | 2,880 | 2,456 | 3,420 | 1,041 |
| උතුර | 1,600 | 1,257 | 1,900 | 601 |
| වයඹ | 2,880 | 2,579 | 3,420 | 1,049 |
| උතුරු මැද | 1,600 | 1,416 | 1,900 | 597 |
| ඌව | 1,600 | 1,377 | 1,900 | 611 |
| සබරගමුව | 1,600 | 1,356 | 1,900 | 536 |
| නැගෙනහිර | 1,600 | 1,290 | 1,900 | 603 |
| **එකතුව** | **32,000** | **27,232** | **38,000** | **12,006** |

*මූලාශ්‍රය: පළාත් සභා*

*තාවකාලික

## 4.2 බලය පවරන ලද මූලාශ්‍රවලින් එකතු කරන ලද ආදායම

බදු ආදායම හා බදු නොවන ආදායම යන මූලාශ්‍ර මඟින් පළාත් ආදායම් එකතු කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය තුළ දැක්වෙන 09 වන උපලේඛනයෙහි 36.01 සිට 36.20 දක්වා කොටසෙහි මෙම මූලාශ්‍ර ලැයිස්තුගත කර ඇත. මේවා අතුරින් ප්‍රධාන වනුයේ මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු සුරාබදු, මුද්දර ගාස්තු හා උසාවි දඩ යනාදියයි.

ජාතික මට්ටමෙන් එකතු කරන ලද ආදායම පළාත් අතර බෙදා ගැනීමේ ක්‍රමවේදය නිසා නොදියුණු පළාත්වලට ස්වකීය ආදායම වැඩි කර ගත හැකි වී තිබේ. එමෙන්ම, එමගින් මුළු පළාත් ආදායමට සිදු වන දායකත්වය ඉහළ ගොස් ඇත.

### වගුව 3: මූලාශ්‍ර අනුව එකතු කරන ලද පළාත් ආදායම (ජුනි දක්වා) - 2013

*(රු. '000)*

| පළාත | ව්‍යාපාර පිරිවැටුම් බදු** | වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු | සුරා බදු | මුද්දර ගාස්තු | උසාවි දඩ | වෙනත්*** | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 34,960 | 1,631,470 | - | 3,342,970 | 285,030 | 1,023,900 | 6,318,330 |
| මධ්‍යම | 7,500 | 368,934 | 68,714 | 422,738 | 47,107 | 108,346 | 1,023,339 |
| දකුණ | 7,769 | 293,000 | 29,174 | 431,321 | 88,419 | 135,270 | 984,953 |
| උතුරු**** | - | 106,293 | - | - | - | 52,772 | 159,065 |
| වයඹ | 656 | 398,895 | 34,224 | 433,917 | 121,638 | 166,098 | 1,155,428 |
| උතුරු මැද | 1,608 | 198,874 | 13,652 | 32,546 | 38,443 | 58,400 | 343,523 |
| ඌව | 4,780 | 112,479 | 18,202 | 50,297 | 25,163 | 81,758 | 292,679 |
| සබරගමුව | - | 226,687 | 16,936 | 94,293 | 31,305 | 94,394 | 463,615 |
| නැගෙනහිර | - | 128,369 | 15,974 | 119,378 | 39,120 | 71,102 | 373,943 |
| **එකතුව** | **57,273** | **3,465,001** | **196,876** | **4,927,460** | **676,226** | **1,792,040** | **11,114,876** |

*මූලාශ්‍රය: පළාත් සභාවල මාසික ආදායම් වාර්තා – 2013 (තාවකාලික)*

***2010 දක්වා හිඟ ව්‍යාපාර පිරිවැටුම් බදු එකතු කිරීම*
**** වෙනත් යටතේ කුලී, පොලී, විභාග ගාස්තු, ප්‍රාග්ධන වත්කම් විකිණීම්, ඔට්ටු බදු ආදිය ඇතුළත්ය*
***** පළාත් සභාව විසින් ප්‍රඥප්තියක් සකස් කර නොමැති හෙයින් පළාත් ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදයක් නොමැත*

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අයත් ප්‍රතිපාදන උපයෝගී කරගෙන එක් එක් පළාත් විසින් සම්මත කරගනු ලැබූ ප්‍රඥප්තිවලට අනුව මුද්දර ගාස්තු හා උසාවි දඩ වශයෙන් පළාත් විසින් රැස් කරන ලද ආදායම් අදාල පළාත් පාලන ආයතන වෙත වාර්ෂිකව මාරු කළ යුතු වේ. මුද්දර ගාස්තු මඟින් උපයන ලද ආදායම උසාවි දඩවලට වඩා වැඩි අගයකින් යුක්ත බව නිරීක්ෂණය කළ හැකිය.

## 4.3 පළාත් ආදායම් ඉලක්ක සැකසීම

පළාත් සම්බන්ධයෙන් ආදායම් ඉලක්ක සැකසීමේ ක්‍රමවේදය පළාත් ආදායමට අදාල ප්‍රධාන මූලාශ්‍ර දෙකක් මත පදනම් වේ.

1. 2010.12.29 දිනැති රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛ 01/2010 ට අනුව මහාභාණ්ඩාගාරය විසින් පළාත්වලට මාරු කළ යුතු වාර්ෂික මුදල් ප්‍රමාණය තීරණය කරනු ලබයි. 2014 වර්ෂයේදී පළාත්වලට මාරුකළ යුතු රජයේ ආදායම පහත දැක්වෙන ප්‍රතිශතයට අනුව සිදු කරන ලදී. මෙම ප්‍රතිශත මුදල් කොමිෂන් සභාවේ හා මහා භාණ්ඩාගාරයේ එකඟතාවයෙන් තීරණය කර ඇත.

| පළාත | අනුපාතය |
|---|---|
| බස්නාහිර | 48% |
| මධ්‍යම /දකුණ/ වයඹ | 9% |
| සබරගමුව /උතුරු මැද/ ඌව/ නැගෙනහිර/ උතුර | 5% |

2. මුදල් කොමිෂන් සභාව විසින් ඉලක්ක කරනු ලබන බලය පවරන ලද මූලාශ්‍රයන්ගේ ආදායම, පළාත් විසින් ඉදිරිපත් කරන ලද ආදායම් එකතුකිරීම පිළිබඳ තක්සේරු හා පළාත් ආදායම් එකතු කිරීමට අදාල අතීත කාර්ය සාධනය මත පදනම් වේ.

මෙම ක්‍රම දෙක යටතේ ඉලක්කගත කරන ලද මුළු ආදායම, පළාත් සඳහා වූ මුළු සාමූහික ප්‍රදාන අවශ්‍යතාවයෙන් අඩු කරනු ලැබේ. පළාත් සඳහා ආදායම් ඉලක්ක සැකසීමේදී මුදල් කොමිෂන් සභාව විසින් මහා භාණ්ඩාගාරය හා පළාත් අධිකාරීන් සමඟ අදහස් හුවමාරුවක නිරත වේ.

### 4.4 2014 වර්ෂය සඳහා ආදායම් පුරෝකථනය

මුදල් කොමිෂන් සභාව විසින් 2014 වර්ෂය සඳහා ආදායම් පුරෝකථනය කිරීමේදී පසුගිය වර්ෂ කිහිපය තුළ හා 2013 වර්ෂයේ පළමු හයමාසය තුළ පළාත් විසින් එකතු කරන ලද සත්‍ය ආදායම පදනම ලෙස යොදා ගන්නා ලදී. මුද්දර ගාස්තු හා උසාවි දඩ ඇතුළත්ව 2014 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාව විසින් පුරෝකථනය කරන ලද සියළුම පළාත්වල බලය පවරන ලද මූලාශ්‍රවලට අයත් ආදායම රු.මිලියන 24,825 කි. 2014 වර්ෂය සඳහා මුද්දර ගාස්තු හා උසාවි දඩ නොමැතිව පුරෝකථනය කරන ලද මුළු ආදායම රු.මිලියන 12,000 කි.

**වගුව 4: 2014 වර්ෂය සඳහා ආදායම් පුරෝකථන**

***(රු.'000)***

| පළාත | මුද්දර ගාස්තු හා උසාවි දඩ ඇතුළත්ව ආදායම් පුරෝකථනය | | | මුද්දර ගාස්තු හා උසාවි දඩ හැර ආදායම් පුරෝකථනය | | |
|---|---|---|---|---|---|---|
| | පළාත් ඇස්තමේන්තුව | මුදල් කොමිෂන් සභාවේ පුරෝකථනය | දල් කොමිෂන් සභාවේ පුරෝකථන ය % ලෙස | පළාත් ඇස්තමේන්තුව | මුදල් කොමිෂන් සභාවේ පුරෝකථනය | මුදල් කොමිෂන් සභාවේ පුරෝකථන ය % ලෙස |
| බස්නාහිර | 9,385,550 | 13,900,000 | 56 | 3,730,550 | 6,000,000 | 50 |
| මධ්‍යම | 2,044,000 | 2,075,000 | 8 | 1,019,000 | 1,050,000 | 9 |
| දකුණ | 2,167,500 | 2,340,000 | 9 | 1,067,500 | 1,150,000 | 10 |
| උතුර | 363,095 | 400,000 | 2 | 363,095 | 400,000 | 3 |
| වයඹ | 2,271,100 | 2,555,000 | 10 | 1,151,100 | 1,200,000 | 10 |
| උතුරු මැද | 1,122,405 | 955,000 | 4 | 876,405 | 700,000 | 6 |
| ඌව | 527,366 | 630,000 | 3 | 347,844 | 400,000 | 3 |
| සබරගමුව | 1,083,550 | 1,210,000 | 5 | 618,550 | 700,000 | 6 |
| නැගෙනහිර | 697,000 | 760,000 | 3 | 342,000 | 400,000 | 3 |
| එකතුව | **19,661,566** | **24,825,000** | **100** | **9,516,044** | **12,000,000** | **100** |

*මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු 2014 සහ මුදල් කොමිෂන් සභාව*

2014 වර්ෂය තුළදී පළාත් සභාව විසින් පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩවල වටිනාකම රු.මිලියන 12,285 කි.

වගුව 5: 2014 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ

*(රු.'000)*

| පළාත | මුද්දර බදු | උසාවි දඩ | එකතුව | පළාත් % |
|---|---|---|---|---|
| බස්නාහිර | 7,200,000 | 700,000 | 7,900,000 | 62 |
| මධ්‍යම | 885,000 | 140,000 | 1,025,000 | 8 |
| දකුණ | 920,000 | 270,000 | 1,190,000 | 9 |
| උතුර | - | - | - | - |
| වයඹ | 950,000 | 405,000 | 1,355,000 | 11 |
| උතුරු මැද | 65,000 | 190,000 | 255,000 | 2 |
| ඌව | 120,000 | 110,000 | 230,000 | 2 |
| සබරගමුව | 380,000 | 130,000 | 510,000 | 4 |
| නැගෙනහිර | 280,000 | 80,000 | 360,000 | 3 |
| **එකතුව** | **10,800,000** | **2,025,000** | **12,825,000** | **100** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව*

** පළාත් සභාව විසින් ප්‍රඥප්තියක් සකස් කර නොමැති හෙයින් පළාත් ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදයක් නොමැත*

අංක 01/2010 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව, 2014 වර්ෂයේදී ජාතික මට්ටමෙන් එකතු කරන ලද රු.මිලියන 35,000 ක් පළාත්වලට මාරු කිරීමට අපේක්ෂා කෙරේ.

වගුව 6: පළාත්වලට මාරු කිරීමට ඇස්තමේන්තුගත කරන ලද රජයේ ආදායම – 2014

*(රු.'000)*

| පළාත | මාරු කිරීම් | පළාත් % |
|---|---|---|
| බස්නාහිර | 16,800,000 | 48 |
| මධ්‍යම | 3,150,000 | 9 |
| දකුණ | 3,150,000 | 9 |
| උතුර | 1,750,000 | 5 |
| වයඹ | 3,150,000 | 9 |
| උතුරු මැද | 1,750,000 | 5 |
| ඌව | 1,750,000 | 5 |
| සබරගමුව | 1,750,000 | 5 |
| නැගෙනහිර | 1,750,000 | 5 |
| **එකතුව** | **35,000,000** | **100** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව*

# 5. පළාත් සඳහා අරමුදල් තක්සේරු කිරීම හා බෙදා වෙන් කිරීම - 2014

අවශ්‍ය කරනු ලබන පළාත් අවශ්‍යතාවයන් ලබා ගැනීමේදී හා අයවැය මාර්ගෝපදේශ තුළ අඩංගු නිර්ණායක පදනම් කරගෙන ඒවා විශ්ලේෂණය කිරීමේදී මුදල් කොමිෂන් සභාව පරිපූර්ණ වූ ක්‍රියාවලියක නිරත වනු ඇත.

- මෙම ක්‍රියාවලියේදී අදාල පළාත් නිලධාරීන් සමඟ සාකච්ඡාවක් සිදු කරනු ලබන අතර, පළාත් සංවර්ධන ප්‍රමුඛතා, අවශ්‍ය කරනු ලබන සේවා සැපයුම සහ සත්‍ය කාර්ය මණ්ඩල ආදිය පිළිබඳව පුළුල් පරාසයක පවත්නා දත්ත හා තොරතුරු භාවිතයට ගනු ලැබේ.
- මෙම ක්‍රියාවලිය හරහා පළාත් අරමුදල් අවශ්‍යතාවයන් පිළිබඳ තක්සේරුවකට එළඹෙන අතර, එකී තොරතුරු මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරනු ඇත.
- මුදල් කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව මහා භාන්ඩාගාරය විසින් පළාත්වලට වෙන්කළ යුතු මුළු අරමුදල් ප්‍රමාණය පිළිබඳ එකඟතාවයකට එළඹෙනු ඇත.
- මුළු අරමුදල් ප්‍රමාණය පිළිබඳව දැනුම් දීමෙන් පසු මුදල් කොමිෂන් සභාව විසින් අදාල නිර්ණායක භාවිතයට ගෙන එකී අරමුදල් පළාත් අතර බෙදා වෙන් කරලීම සිදු කරනු ඇත.
- මුදල් විෂය භාර අමාත්‍යවරයා ලෙස ප්‍රධාන අමාත්‍යවරයා විසින් පළාත් අයවැය පළාත් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. එහිදී එකඟතාවයකට පැමිණීමෙන් අනතුරුව ආණ්ඩුකාරවරයා වෙත අයවැය ඉදිරිපත් කරනු ලබන අතර, ඔහු විසින් එය අනුමැතිය සඳහා පළාත් සභාවට යොමු කරනු ලබයි.
- ව්‍යවස්ථානුකූල ප්‍රතිපාදනවලට අනුව මුදල් කොමිෂන් සභාව විසින් වාර්ෂික අයවැයෙන් සපයන ලද අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීමට අදාල මූලධර්ම අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතුව ඇත.

## 5.1 පළාත් ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතා ඉල්ලුම් කිරීම

2013 වර්ෂයේ මාර්තු 21 වන දින මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද "අරමුදල් ඉල්ලුම් කිරීමට අදාල මාර්ගෝපදේශ" වලට අනුකූල වන පරිදි 2014 වර්ෂය සඳහා ස්වකීය මූල්‍ය අවශ්‍යතා ඉදිරිපත් කරන මෙන් පළාත් අධිකාරීන් වෙත දැනුම් දෙන ලදී. ඔවුනගේ වාර්ෂික ප්‍රාග්ධන අවශ්‍යතා ඉදිරිපත් කිරීමේදී මාර්ගෝපදේශවලට අමුණා ඇති ආකෘතිපත්‍ර - 2 භාවිතා කරන ලෙස උපදෙස් සපයන ලදී.

වගුව 7: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ පළාත් ඉල්ලීම් - 2014

*රු.මි.*

| පළාත | මුළු ඇස්තමේන්තුව | පළාත් % |
|---|---|---|
| බස්නාහිර | 10,776 | 17.25 |
| මධ්‍යම | 4,487 | 7.18 |
| දකුණු | 16,038 | 25.68 |
| උතුරු | 5,375 | 8.60 |
| වයඹ | 5,279 | 8.45 |
| උතුරු මැද | 4,066 | 6.51 |
| ඌව | 7,942 | 12.71 |
| සබරගමුව | 3,047 | 4.88 |
| නැගෙනහිර | 5,454 | 8.73 |
| **එකතුව** | **62,464** | **100** |

*මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු - 2014*
*සටහන: ජාතික වශයෙන් එකඟ වී ඇති විදේශ හා දේශීය ව්‍යාපෘති හැර*

පුනරාවර්තන වියදම් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් පුද්ගලික පඩිනඩි හා අනෙකුත් පුනරාවර්තන වියදම් වශයෙනි. පුද්ගල පඩිනඩි තුළට වැටුප් හා වේතන, අතිකාල හා නිවාඩු දින දීමනා සහ සේවක දීමනා ඇතුළත් වේ. අනෙකුත් පුනරාවර්තන වියදම් ලෙස සලකනු ලබනුයේ ප්‍රවාහන වියදම්, සැපයීම්, නඩත්තු කිරීම්, කොන්ත්‍රාත් සේවා, අනෙකුත් ආයතනවලට කරනු ලබන මාරුකිරීම්, ප්‍රදාන, සහනාධාර සහ පොලී ගෙවීම් ආදියයි. මුදල් කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘතිපත්‍ර වලට අනුව පළාත් විසින් පළාත් පුනරාවර්තන වියදම් අවශ්‍යතා ඉල්ලුම් කරනු ලබයි.

වගුව 8: පුනරාවර්තන වියදම්වලට අදාලව පළාත් විසින් කරන ලද ඉල්ලීම් – 2014 (පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම්, මුද්දර බදු හා උසාවි දඩ ඇතුළත්ව)

*(රු.'000)*

| අංකය | පළාත | පුද්ගල පඩි නඩි | පළාත් % | වෙනත් පුනරාවර්තන වියදම් | පළාත් % | මුළු පුනරාවර්තන වියදම් |
|---|---|---|---|---|---|---|
| **1** | බස්නාහිර | 26,689,728 | 65 | 14,610,998 | 35 | **41,300,726** |
| **2** | මධ්‍යම | 17,788,698 | 72 | 7,011,146 | 28 | **24,799,844** |
| **3** | දකුණු | 16,430,701 | 75 | 5,493,863 | 25 | **21,924,564** |
| **4** | උතුරු | 11,318,696 | 76 | 3,544,744 | 24 | **14,863,440** |
| **5** | වයඹ | 17,470,734 | 77 | 5,313,160 | 23 | **22,783,894** |
| **6** | උතුරු මැද | 10,845,225 | 77 | 3,221,068 | 23 | **14,066,293** |
| **7** | ඌව | 12,318,027 | 76 | 3,963,477 | 24 | **16,281,504** |
| **8** | සබරගමුව | 15,761,454 | 77 | 4,623,102 | 23 | **20,384,556** |
| **9** | නැගෙනහිර | 12,757,386 | 71 | 5,103,347 | 29 | **17,860,733** |
| | එකතුව | **141,380,649** | **73** | **52,884,905** | **27** | **194,265,554** |

*මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු – 2014*

## 5.2 පළාත් අවශ්‍යතා තක්සේරු කිරීම

රජයට නිර්දේශ ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් පළාත් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතාවයන් මුදල් කොමිෂන් සභාව විසින් ඉතා සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කරනු ලබයි. මෙලෙස අධ්‍යයනය කිරීමේදී රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව සමඟ අනුගත වීම, මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ සමඟ ගැලපීම, පළාත්වල මධ්‍යකාලීන සැලසුම්, මහා භාණ්ඩාගාරය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ සහ අරමුදල් භාවිතය පිළිබඳ පෙර වර්ෂවල කාර්යසාධනය වැනි සාධක පිළිබඳ සැලකිලිමත් වේ.

මුදල් කොමිෂන් සභාව විසින් පළාත් ප්‍රාග්ධන අවශ්‍යතාවයන් තක්සේරු කිරීමේදී, ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව හා පළාත් මධ්‍යකාලීන සැලසුම්වල අන්තර්ගතය කෙරෙහි සැලකිලිමත් වේ. තවද, සේවා සැපයීම් නඩත්තුව, සේවා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, සැලසුම්ගත ප්‍රතිඵල ඵලදායී ලෙස ළඟා කර ගැනීම, ද්විකරණය වැළැක්වීම සහ සම්පත් නාස්තිය පිටුදැකීම, ප්‍රමුඛ අවශ්‍යතාවයන් කෙරෙහි විශේෂ අවධානය සහ පළාත් ආයතනවල ක්‍රියාත්මක ධාරිතාවය යන කරුණු කෙරෙහි නිසි අවධානය යොමු කරනු ඇත.

**වගුව 9: අනෙකුත් පුනරාවර්තන වියදම්වලට අදාලව පළාත් විසින් කරන ලද ඉල්ලීම් – 2014 (පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම්, මුද්දර බදු හා උසාවි දඩ හැර)**

**(රු.'000)**

| පළාත | වෙනත් පුනරාවර්තන වියදම් |
|---|---|
| බස්නාහිර | 5,800,731 |
| මධ්‍යම | 4,542,740 |
| දකුණු | 3,983,342 |
| උතුරු | 2,532,592 |
| වයඹ | 3,271,468 |
| උතුරු මැද | 2,617,319 |
| ඌව | 3,288,836 |
| සබරගමුව | 3,180,102 |
| නැගෙනහිර | 3,849,162 |
| **එකතුව** | **33,066,292** |

*මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු – 2014*

**වගුව 10: මුදල් කොමිෂන් සභාව විසින් තක්සේරු කරන ලද ප්‍රාග්ධන අවශ්‍යතා - 2014**

***(රු.මි.)***

| පළාත | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | | උපමාන පාදක ප්‍රදාන | |
|---|---|---|---|---|
| | මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය | පළාත් % | මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය | පළාත් % |
| බස්නාහිර | 5,955 | 14.2 | 1,222 | 13.6 |
| මධ්‍යම | 5,271 | 12.6 | 1,104 | 12.3 |
| දකුණ | 5,001 | 11.9 | 1,100 | 12.2 |
| උතුර | 3,885 | 9.3 | 886 | 9.8 |
| වයඹ | 4,431 | 10.6 | 916 | 10.2 |
| උතුරු මැද | 3,574 | 8.5 | 800 | 8.9 |
| ඌව | 4,418 | 10.5 | 954 | 10.6 |
| සබරගමුව | 5,015 | 11.9 | 1,048 | 11.6 |
| නැගෙනහිර | 4,450 | 10.6 | 970 | 10.8 |
| **එකතුව** | **42,000** | **100** | **9,000** | **100.0** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව*

පළාත් විසින් ඉදිරිපත් කරන ලද පුනරාවර්තන අවශ්‍යතාවයන් තක්සේරු කිරීමේදී මතු දැක්වෙන කරුණු කෙරෙහි මුදල් කොමිෂන් සභාව සැලකිලිමත් වේ. එනම්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය හා ඇබෑර්තු, රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභා විසින් එකඟත්වයට පැමිණි නව පත්වීම්, පුද්ගල පඩිනඩි, හිඟ වැටුප් හා කාර්ය මණ්ඩල ණය පිළිබඳ

ඇස්තමේන්තු, ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරිම ඇතුළු අනෙකුත් පුනරාවර්තන වියදම් පිළිබඳ ඇස්තමේන්තු, ඡන්දයෙන් තේරී පත්වූ නියෝජිතයින් සඳහා දීමනා සහ පළාත් පාලන ආයතන හා අනෙකුත් ආයතනවලට සිදුකළ යුතු මාරු කිරීම් යනාදියයි.

**වගුව 11: පළාත් තත්‍ය කාර්යමණ්ඩල සඳහා තක්සේරු කරන ලද පුද්ගල පඩිනඩි – 2014**

| අංකය | පළාත | සත්‍ය කාර්යමණ්ඩලය | % | පුද්ගල පඩි නඩි (රු.'000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වැටුප් හා වේතන | % | අතිකාල හා නිවාඩු දින ගෙවීම් | % | වෙනත් දීමනා | % | එකතුව (පුද්ගල පඩි නඩි) | % |
| 1 | බස්නාහිර | 54,074 | 18 | 14,983,558 | 20 | 1,609,633 | 16 | 8,271,852 | 19 | 24,865,043 | 19 |
| 2 | මධ්‍යම | 39,775 | 13 | 9,188,673 | 12 | 1,129,436 | 11 | 5,575,102 | 13 | 15,893,211 | 12 |
| 3 | දකුණ | 35,950 | 12 | 8,509,453 | 11 | 991,957 | 10 | 5,022,957 | 11 | 14,524,367 | 11 |
| 4 | උතුර | 27,061 | 9 | 5,617,964 | 8 | 843,991 | 8 | 3,824,510 | 9 | 10,286,465 | 8 |
| 5 | වයඹ | 38,740 | 13 | 9,267,598 | 13 | 1,236,145 | 12 | 5,499,883 | 12 | 16,003,626 | 12 |
| 6 | උතුරු මැද | 21,316 | 7 | 4,856,843 | 7 | 876,784 | 9 | 3,030,645 | 7 | 8,764,272 | 7 |
| 7 | ඌව | 27,133 | 9 | 6,219,599 | 8 | 971,143 | 10 | 3,973,545 | 9 | 11,164,287 | 9 |
| 8 | සබරගමුව | 31,239 | 10 | 8,840,326 | 12 | 1,630,156 | 16 | 4,697,609 | 11 | 15,168,091 | 12 |
| 9 | නැගෙනහිර | 28,884 | 9 | 6,625,537 | 9 | 682,190 | 7 | 4,478,538 | 10 | 11,786,265 | 9 |
| **එකතුව** | | **304,172** | **100** | **74,109,551** | **100** | **9,971,435** | **100** | **44,374,641** | **100** | **128,455,627** | **100** |

*මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු 2014 සහ මුදල් කොමිෂන් සභාව*

*සටහන: පුරප්පාඩු හැර*

**වගුව 12: පළාත් සඳහා තක්සේරු කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම් - 2014 (මුද්දර බදු හා උසාවි දඩ නොමැතිව)**

**(රු.'000)**

| අංකය | පළාත | පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම් හැර වෙනත් පුනරාවර්තන වියදම් | % | පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම් | % | පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම් සමග වෙනත් පුනරාවර්තන වියදම් |
|---|---|---|---|---|---|---|
| **1** | බස්නාහිර | 5,792,231 | 20 | 5,058,767 | 45 | **10,850,998** |
| **2** | මධ්‍යම | 3,499,940 | 12 | 1,378,126 | 12 | **4,878,066** |
| **3** | දකුණ | 2,985,272 | 10 | 934,087 | 8 | **3,919,359** |
| **4** | උතුර | 2,514,598 | 9 | 1,012,152 | 9 | **3,526,750** |
| **5** | වයඹ | 3,271,468 | 11 | 782,738 | 7 | **4,054,206** |
| **6** | උතුරු මැද | 2,280,320 | 8 | 322,095 | 3 | **2,602,415** |
| **7** | ඌව | 3,288,836 | 11 | 484,641 | 4 | **3,773,477** |
| **8** | සබරගමුව | 3,180,102 | 11 | 571,575 | 5 | **3,751,677** |
| **9** | නැගෙනහිර | 2,204,102 | 8 | 652,686 | 6 | **2,856,788** |
| **එකතුව** | | **29,016,869** | **100** | **11,196,867** | **100** | **40,213,736** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව*

## 5.3 පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල අනුව පළාත් අතර අරමුදල් බෙදා හැරීම මුදල් කොමිෂන් සභාව සතු ප්‍රධාන කාර්යයක් වේ. මහා භාණ්ඩාගාරයත් සමඟ එකඟතාවයකින් යුතුව අයවැයෙන් සම්පූර්ණ අරමුදල් වෙන් කිරීමෙන් අනතුරුව මෙම බෙදා වෙන් කිරීම සිදු කරන ලැබේ. සියලුම පළාත් ආයතන ස්වකීය වාර්ෂික අයවැය සැකසීමෙන් අනතුරුව ඒවා පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බැවින්, මුදල් කොමිෂන් සභාව විසින් අරමුදල් බෙදා හැරීමේදී අවශ්‍යතා තක්සේරු කිරීම දැඩි ලෙස අවධානයට ගනු ඇත. මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව ප්‍රාග්ධන අරමුදල් (පළාත් නිශ්චිත සංවර්ධන හා උපමාන පාදක) පළාත් අතර බෙදා දෙන ලද ආකාරය පහත වගුව මඟින් විස්තර කෙරේ. ජාතික මට්ටමෙන් විදේශාධාර හා දේශීය අරමුදල් යොදවා ගෙන ක්‍රියාකත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් ද මෙයට ඇතුළත් වේ.

**වගුව 13: ප්‍රාග්ධන අරමුදල් බෙදා වෙන් කිරීම – 2014**

*රු.මි.*

| පළාත | උපමාන පාදක ප්‍රදාන | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | උප එකතුව | % | සංවර්ධන ව්‍යාපෘති* | එකතුව | % |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 475 | 1,270 | 1,745 | 12.95 | 1,510 | 3,255 | 9.87 |
| මධ්‍යම | 430 | 1,230 | 1,660 | 12.32 | 2,267 | 3,927 | 11.91 |
| දකුණ | 380 | 1,230 | 1,610 | 11.95 | 485 | 2,095 | 6.35 |
| උතුර | 280 | 1,035 | 1,315 | 9.76 | 4,516 | 5,831 | 17.69 |
| වයඹ | 350 | 1,140 | 1,490 | 11.06 | 980 | 2,470 | 7.49 |
| උතුරු මැද | 350 | 1,000 | 1,350 | 10.02 | 2,043 | 3,393 | 10.29 |
| ඌව | 330 | 1,150 | 1,480 | 10.98 | 2,393 | 3,873 | 11.75 |
| සබරගමුව | 335 | 1,150 | 1,485 | 11.02 | 3,095 | 4,580 | 13.89 |
| නැගෙනහිර | 340 | 1,000 | 1,340 | 9.94 | 2,206 | 3,546 | 10.76 |
| **එකතුව** | **3,270** | **10,205** | **13,475** | **100** | **19,495** | **32,970** | **100** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව*
**ජාතික වශයෙන් එකඟ වූ විදේශීය හා දේශීය ව්‍යාපෘති*

## 5.4 සැලසුම්කරණය හා පළාත් සැලසුම් අනුමත කිරීමේ ක්‍රමවේදය

ව්‍යවස්ථාමය ප්‍රතිපාදනවලට අනුව කිසියම් පළාතක ආණ්ඩුකාරවරයා විසින් සෑම මුදල් වර්ෂයකටම අදාලව,එම මුදල් වර්ෂය ආරම්භවීමට යටත් පිරිසෙයින් මාස තුනකට ප්‍රථම, ඇස්තමේන්තුගත ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනයක් පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු බව දැනුම් දෙනු ලබයි. මෙය වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය ලෙස හඳුන්වනු ලැබේ. එක් එක් පළාත් සභාවන් ස්වකීය සැලසුම් හා අයවැය ක්‍රියාවලියට අදාල පාලන විධි පිළිබඳමුදල් රෙගුලාසි විස්තරාත්මකව සකස් කරගෙන ඇත. අනුමත නීතිරීතිවලට අනුව පළාත් සභාවක සියලුම කාර්යයන් පූර්වයෙන් නිශ්චය කළ යුතු අතර, ස්වකීය සැලසුම් හා වැඩසටහන් ඒ අනුව සකස්කර ගත යුතු වේ.

කිසියම් පළාත් සභාවක වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය මඟින් ගම්‍යවනුයේ අදාල මුදල් වර්ෂය සඳහා පළාත් සභාවේ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී වැඩසටහන් පැහැදිලිව දැක්වෙන මූල්‍යමය ඉදිරිපත් කිරීමකි. එබැවින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සැකසීම යනු මනා සම්බන්ධීකරණයක් හා අවධානයක් අවශ්‍ය කරනු ලබන තීරණාත්මක වැදගත්කමකින් යුත් කාර්යයකි.

වගුව 14: සාමූහික ප්‍රදාන බෙදා වෙන් කිරීම – 2014

(රු.'000)

| අංකය | පළාත | සාමූහික ප්‍රදාන |
|---|---|---|
| 1 | බස්නාහිර | 9,000,000 |
| 2 | මධ්‍යම | 15,600,000 |
| 3 | දකුණ | 13,800,000 |
| 4 | උතුර | 11,500,000 |
| 5 | වයඹ | 15,000,000 |
| 6 | උතුරු මැද | 9,000,000 |
| 7 | ඌව | 11,000,000 |
| 8 | සබරගමුව | 14,000,000 |
| 9 | නැගෙනහිර | 12,500,000 |
| | **එකතුව** | **111,400,000** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව*

ආදායම් සම්බන්ධයෙන් ගත්විට පළාත් භාණ්ඩාගාරය විසින් රජයෙන් ලැබෙන ප්‍රදාන සහ පළාත්බද හා අනෙකුත් ලැබීම් ඇස්තමේන්තු කළ යුතු අතර, විවිධ අමාත්‍යාංශ සඳහා වූ වෙන් කිරීම් පිළිබඳ හැඟවීමක් ඉදිරිපත් කළ යුතුය. මෙම හැඟවීම් පදනම් කොටගෙන එක් එක් අමාත්‍යාංශ යටතට ගැනෙන දෙපාර්තමේන්තු විසින් ස්වකීය දල මුදල් ප්‍රකාශන සකස් කළ යුතු වේ. අවසානයේ පළාත සඳහා අවශ්‍ය කරනු ලබන මූල්‍ය අවශ්‍යතාවයන් ගණනය කිරීමේදී මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

## 5.5 පළාත් පාලන ආයතන මූල්‍යනය

පළාත් වෙතින් පළාත් පාලන ආයතනවලට මාරු කරනු ලබන අරමුදල්වල ප්‍රධානම කොටස වනුයේ අනුමත තත්‍ය කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන වැටුප් සහ සභිකයින් වෙත ගෙවනු ලබන දීමනා වේ. වර්තමානයේදී කාර්ය මණ්ඩල වැටුප් මුළුමනින්ම පාහේ සාමූහික ප්‍රදාන ප්‍රතිපූරණය කිරීම මඟින් ගෙවනු ලැබේ. කොන්ත්‍රාත් හා තාවකාලික පදනමින් බඳවාගත් සේවකයින් සඳහා මුලදී වැටුප් ගෙවනු ලැබූයේ උපයාගත් ආදායම්වලින්ය. මෑතදී මෙම සේවකයින් අනුමත කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කරන ලදී. ඒ අනුව සේවකයන්ගේ මුළු වැටුප් ප්‍රමාණයන් සාමූහික ප්‍රදානවලින් සිදු කරනු ලබන මාරුකිරීම් මඟින් ගෙවනු ඇත. ඒ අනුව රැස් කරන ලද ආදායම මහජනතාවගේ සේවා සැපයුම වඩාත් කාර්යක්ෂම හා වැඩිදියුණු කිරීම සඳහා යෙදවීම අපේක්ෂා කෙරේ.

වගුව 15: පළාත් පාලන ආයතනවල සේවක වැටුප් හා සභිකයින්ගේ දීමනා ගෙවීම සඳහා මුදල් වෙන් කිරීම් – 2014

| පළාත | මහ නගර සභා | නගර සභා | ප්‍රාදේශීය සභා | පළාත් පාලන ආයතන මුළු එකතුව | සාමාජිකයින්ගේ දීමනා | | කාර්ය මණ්ඩල වැටුප් ප්‍රතිපූරණය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | සාමාජිකයන් ගණන | දීමනාව (රු.'000) | සත්‍ය | මුදල (රු.'000) |
| බස්නාහිර | 7 | 14 | 27 | 48 | 884 | 62,034 | 16,334 | 4,996,733 |
| මධ්‍යම | 4 | 6 | 33 | 43 | 634 | 43,098 | 4,411 | 1,335,028 |
| දකුණ | 3 | 4 | 42 | 49 | 582 | 40,188 | 3,054 | 893,890 |
| උතුර | 1 | 5 | 28 | 34 | 398 | 27,030 | 3,524 | 985,122 |
| වයඹ | 1 | 3 | 29 | 33 | 498 | 33,954 | 2,449 | 782,738 |
| උතුරු මැද | 1 | 0 | 25 | 26 | 294 | 20,034 | 1034 | 302,061 |
| ඌව | 2 | 1 | 25 | 28 | 327 | 22,428 | 1,585 | 385,659 |
| සබරගමුව | 1 | 3 | 25 | 29 | 424 | 28476 | 1,742 | 543,099 |
| නැගෙනහිර | 3 | 5 | 37 | 45 | 447 | 31,499 | 2,094 | 621,187 |
| **එකතුව** | **23** | **41** | **271** | **335** | **4488** | **308,741** | **36,227** | **10,845,517** |

*මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු සහ මුදල් කොමිෂන් සභාව* -2014

## 6. ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය සමඟ අනුගත වීම

රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවෙහි ප්‍රධාන අරමුණ වනුයේ රට මධ්‍ය ආදායම් කාණ්ඩයේ ආර්ථිකයක් බවට පත් කිරීම හා 2016 වන විට ඇ.එ.ඩොලර් 4,470 ක ඒක පුද්ගල ආදායමක් සහතික කරලීමය. 2014-2016 කාල සීමාව සඳහා වූ රාජ්‍ය ආයෝජන උපායමාර්ගයෙහි දැක්වෙන පරිදි 2020 වන විට ඒක පුද්ගල ආදායම් ඇ.එ.ඩොලර් 8,500 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. මෙම අරමුණු ළඟා කර ගැනීමේ දී සාර්ව මට්ටමේ සංවර්ධන උපායමාර්ගයන් වන නාවික, ගුවන්, වාණිජ, බලශක්ති හා දැනුම යන පංච කේන්ද්‍ර සංකල්පය යටතේ ක්‍රියා කරනු ඇත. තවද, ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් හඳුන්වාදීම මඟින් 8% ක ඉහළ වාර්ෂික වර්ධන වේගයක් අත්පත් කරගැනීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම, රටෙහි දරිද්‍රතා අනුපාතය 2020 වන විට 2% දක්වා අඩු කිරීමට අපේක්ෂා කරනු ලබන අතර, රටෙහි සමස්ත සන්තෘෂ්ටි දර්ශකය (Happiness Index) ආසියාවේ ප්‍රථම ස්ථානයට ගෙන ඒමට අදහස් කෙරේ. මුදල් කොමිෂන් සභාව විසින් පළාත්වල ප්‍රතිපත්ති සැලසුම් සහ ව්‍යාපෘති සැකසීම සඳහා අවශ්‍ය කරනු ලබන මගපෙන්වීම් සිදු කිරීමේදී රජයේ මෙම සාර්ව ඉලක්ක කෙරෙහි අවධානය යොමු කර ඇත.

ඉහතින් දැක්වෙන සාර්ව මට්ටමේ උපායමාර්ගවලට අනුගත වන පරිදි ස්වකීය මධ්‍යකාලීන ආයතනික ප්‍රතිඵල රාමු හා වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කරන ලෙස මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ මඟින් පළාත්වලට උපදෙස් සපයා ඇත. මෙම උපායමාර්ගය යටතේ දැක්වෙන ප්‍රධාන ප්‍රවේශයන් පහත පරිදි වේ.

### 6.1 සෑම පුරවැසියෙකුගේම අවම ජීවන මට්ටම සහතික කරලන පරිදි ප්‍රාදේශීය විෂමතා අවම කිරීම

මෙහිදී ඉතා වැදගත් කරුණක් වනුයේ දැනටමත් ශ්‍රී ලංකාව විෂයයෙහි ගත් විට සාර්ව සහ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ ඉලක්ක ඉක්මවා ගොස් ඇති බවයි. විශේෂයෙන් දරිද්‍රතාවය, සේවා නියුක්තිය, සෞඛ්‍යය හා අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර තුළ මෙම ඉදිරිගාමී තත්ත්වය විද්‍යමාන වේ. කෙසේ වුවද, පර්යේෂණ හා අධ්‍යයන මඟින් පෙන්වා දී ඇති පරිදි තවමත් පළාත් තුළ හුදකලා හා පසුගාමී ගම් දක්නට ලැබෙන අතර, ඒවා සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් වී නොමැත. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන මුදල් කොමිෂන් සභාව විසින් 2014 වර්ෂය සඳහා පළාත්වලට අරමුදල් වෙන් කිරීමේ දී මෙවැනි ගම් සංවර්ධනය සඳහා රු.මි. 500 ක් වෙන් කර ඇත. අරමුදල් යෙදවීමේ ප්‍රගතිය මත ඉදිරියේ දී අරමුදල් වෙන් කිරීම පිළිබඳව සැලකිලිමත් වනු ඇත.

කෙසේ වුවද, අධ්‍යාපන, සෞඛ්‍ය හා සමාජ සංවර්ධනය යන ක්ෂේත්‍ර තුළ විශාල වශයෙන් පළාත් මට්ටමෙන් අරමුදල් යෙදවේ. මෙම අරමුදල් ආයෝජනය කිරීමේ දී අධ්‍යාපන හා සෞඛ්‍ය යන අංශවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට සහ සහස්‍ර සංවර්ධන දර්ශක විෂයෙහි පවත්නා පරතරයන් පියවීම සඳහා ප්‍රමුඛතාවය දිය යුතු වේ. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සහස්‍ර සංවර්ධන ඉලක්ක විෂයයෙහි බලන විට, දරිද්‍රතා මට්ටම අඩකින් අඩු කිරීම හා පානීය ජලය හා සනීපාරක්ෂාවට අදාල ඉලක්ක පහසුවෙන් අත්කර ගෙන ඇත. තවද, ළමා හා මාතෘ සෞඛ්‍ය හා ප්‍රාථමික සෞඛ්‍ය සේවා සම්බන්ධයෙන් ලබා ඇති ප්‍රගතියට පළාත් විසින් මහඟු දායකත්වයක් සපයා ඇත. සාක්ෂරතාවය, ප්‍රාථමික අධ්‍යාපන අවස්ථා, අධ්‍යාපනය නිම කිරීමේ අනුපාතය සහ සර්වජන ප්‍රාථමික අධ්‍යාපනය, අධ්‍යාපනයේ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය වැනි සහස්‍ර සංවර්ධන ඉලක්ක විෂයයෙහි ගත් විට ලබා

ඇති ප්‍රගතිය ප්‍රශංසනීය වේ. තවද, එච්.අයි.වී, මැලේරියාව සහ වෙනත් බෝවන රෝග පාලනය කිරීමෙහි ලා අත්කරගෙන තිබෙන ප්‍රගතිය පැසසුමට ලක්විය යුතුය.

ළදරු මරණ අනුපාතය, අවුරුදු 05 ට අඩු ළමුන්ගේ මරණ අනුපාතිකය, මාතෘ මරණ අනුපාතිකය සහ උපතේ සිට ආයු අපේක්ෂාව වැනි දර්ශක විෂයෙහි ද ලබා ඇති ප්‍රගතියට රජය විසින් ක්‍රියාත්මක කරන ලද සඵලදායී ප්‍රතිපත්ති හා වැඩසටහන් බෙහෙවින් ඉහවල් වී ඇත. සමස්තයක් ලෙස මෙම ප්‍රශංසනීය කාර්යසාධනය සඳහා නිදහස් සෞඛ්‍ය හා අධ්‍යාපන ප්‍රතිපත්ති, වෛද්‍යවරුන් ඇතුළු සෑම මට්ටමකම වෘත්තිකයනේග් කැපවීම සහ ශක්තිමත් රෝග නිවාරණ හා ප්‍රතිකාර ක්‍රමවලට අදාල යටිතල පහසුකම් සංවර්ධනය යනාදිය ඍජු ලෙස දායක වී ඇත.

### 6.2 ග්‍රාමීය ප්‍රජාවට වැඩි ආදායම් උත්පාදන අවස්ථා නිර්මාණය කිරීම

පළාත්වල වෙසෙන ජනතාවගේ ප්‍රතිලාභය සඳහා සංචාරක කර්මාන්තයේ වර්ධනය බෙහෙවින් උපකාරී වේ. ප්‍රජා පාදක සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම මඟින් ග්‍රාමීය අංශයේ රැකියා නිෂ්පාදනය මෙන්ම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය ද සිදු කළ හැකිය. මෙහිදී ග්‍රාමීය තරුණ පිරිස් සංචාරක ව්‍යාපාරයට අදාල රැකියාවන්හී පුහුණු කිරීම ඉතා අවශ්‍ය වේ.

තවද, ග්‍රාමීය මට්ටමේ කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනයනට වෙළඳපොළ අවස්ථා සැපයීමේ පහසුකම් සපයන්නන් ලෙස පළාත් පාලන ආයතන ඵලදායී අයුරින් යොදා ගැනීමට පුළුවන.

### 6.3 තිරසාර සංවර්ධනයක් සඳහා පළාත් හා ග්‍රාමීය මාර්ග සංවර්ධනය

මාර්ග පහසුකම් වර්ධනය කිරීමෙහි ලා පළාත් මඟින් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එබැවින්, රටෙහි සමාජ-ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීමේ දී මාර්ග ජාලය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් පළාත්වලට අදාලව පහත දැක්වෙන ප්‍රමුඛතා පරාසයන් හඳුනාගෙන තිබේ.

(i) මාර්ග නඩත්තුව - තිරසාර මාර්ග පද්ධතියක පැවැත්ම සඳහා පරිගණක පදනම් කරගත් දත්ත පදනමක් පවත්වාගෙන යෑම, නඩත්තුලට අදාල කාල රාමු හඳුනාගැනීම සහ යෝජිත ඉදිරි ක්‍රියාමාර්ග සැලසුම් කිරීම ඉතා අවශ්‍ය වේ.

(ii) මාර්ග සංවර්ධනය හා නඩත්තුව වෙනුවෙන් ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීමක් සිදු කිරීම සහතික කරනු වස් පළාත් මට්ටමෙන් "මාර්ග නඩත්තු භාර අරමුදලක්" පවත්වා ගත යුතු වේ. මෙමඟින් වසර 2017 වන විට සියලුම "සී" හා "ඩී" මාර්ග කාපට් කිරීම සම්පූර්ණ කළ හැකිය.

(iii) මාර්ග සංවර්ධන කාර්යයට අදාල තාක්ෂණික නිලධාරීන්ගේ අවශ්‍යතාවය සහතික කරලීම අත්‍යවශ්‍ය සාධකයකි. තවද, මාර්ග අංශයට අදාල සේවකයින්ගේ හා කොන්ත්‍රාත්කරුවන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගත යුතු වේ.

(iv) ආර්ථිකමය වශයෙන් වාසි සහගත පරිදි මාර්ග සැලසුම්, ද්‍රව්‍ය සැපයීම හා ඉදිකිරීම් තාක්ෂණය ප්‍රවර්ධනය කිරීමට හැකි වන පරිදි මාර්ග අංශයට අදාල පර්යේෂණ දිරිමත් කළ යුතුව ඇත.

(v) ඉදිකරන ලද මාර්ග තිරසාර අයුරින් පවත්වා ගැනීම සඳහා ජල සැපයුම, විදුලි බලය හා සන්නිවේදන වැනි අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වාගත යුතු වේ.

(vi) මාර්ග ජාලයේ තිරසාර නඩත්තුව සහතික කරනු වස් ඉදිකිරීම් හා නඩත්තු කටයුතුවලට අවශ්‍ය කරනු ලබන නවීන යන්ත්‍රෝපකරණ හිඟයකින් තොරව සැපයීම අවශ්‍ය කෙරේ.

(vii) මාර්ග අංශයට අදාලව නිවැරදි ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සැකසීම සහ අවශ්‍ය ඉඩම් නිසි කලට අත්පත් කරගැනීම මෙම අංශයේ කාර්යක්ෂම හා තිරසාර සේවා සැපයුමට අත්‍යවශ්‍ය සාධකයක් වේ.

## 6.4 පළාත් සභා සඳහා නව හා විකල්පමය ආදායම් මාර්ග

පළාත් ආදායමෙන් විශාල කොටසක් රඳා පවතිනුයේ මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරනු ලබන සම්පත් මතය. මෙම භාණ්ඩාගාර අරමුදල්වලින් 80% ක් පමණ වැය කරනුයේ වැටුප් හා ගෙවීම් ඇතුළත් පුනරාවර්තන වියදම් වෙනුවෙනි. පළාත්වලට වෙන් කරනු ලබන ප්‍රාග්ධන අරමුදල් ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට තුඩුදෙන සංවර්ධන හා රැකියා උත්පාදන ව්‍යාපෘතිවල ආයෝජනය කිරීම අපේක්ෂා කෙරේ. තවද, රේඛීය අමාත්‍යාංශ හා ආයතන මඟින් පළාත් හා දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලබන ජාතික මට්ටමේ සංවර්ධන කාර්යයන්ට සහාය දීම ද අපේක්ෂිත කාර්යයකි. කෙසේ වුවද, ප්‍රාග්ධන අරමුදල්වලින් වැඩි ප්‍රතිශතයක් විශාල ගොඩනැගිලි ඉදිකිරීමට හා නාගරික පදනමකින් යුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබේ.

දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනයට අයත් පළාත් ආදායම් ලැයිස්තුව තුළ පළාත් අධිකාරීන් විසින් එකතු කළ යුතු ආදායම් මූලාශ්‍ර 21 ක් දැක්වේ. කෙසේ වුවද, 2014 වර්ෂය තුළ බස්නාහිර පළාත ඇතුළත් නොකර බලන විට ඇස්තමේන්තුගත ආදායම මුළු ඇස්තමේන්තුගත වියදමෙන් 18% ක් තරම් පහළ අගයක පවතී. මෙම අනුපාතය බස්නාහිර පළාත සම්බන්ධයෙන් ගත් විට 71.5% ක් වේ.

මෙම තත්ත්වය තුළ ආයෝජන දිරිගැන්වීම, ආදායම් පදනම ශක්තිමත් කිරීම සහ පෞද්ගලික අංශය දිරිමත් කිරීම සඳහා හිතකර පරිසරයක් ඇති වන පිරිදි සියලුම පළාත් විසින් නව ප්‍රවේශයක් හඳුන්වා දීම අත්‍යවශ්‍ය වේ. ඒවා අතර, පහත දැක්වෙන ක්‍රියාමාර්ග ඉතා වැදගත් වනු ඇත.

- **පළාත් සංවර්ධන කාර්යයන් තුළ පෞද්ගලික අංශයට පහසුකම් සැපයීම -** මෙහිදී නීතිමය බාධක ඉවත් කිරීම, ඉඩම් අත්පත් කරගැනීමේ දුෂ්කර කාර්ය පටිපාටිය සරල කිරීම, පාරිසරික හා නීතිමය අනුමැතිය ලබාදීම පහසු කරවීම සහ කාර්යක්ෂම නියාමන යාන්ත්‍රණ හඳුන්වාදීම ඉතා වැදගත් වේ.

- **පළාත් මට්ටමෙන් ආදායම් උපයෝජනය සඳහා නව්‍ය ප්‍රවේශයන්ගේ අවශ්‍යතාවය -** මහා භාණ්ඩාගාරය හා මුදල් කොමිෂන් සභාව විසින් ලබාදෙන අරමුදල් මත බෙහෙවින් රඳා සිටිනවා වෙනුවට පවරන ලද ආදායම් මූලාශ්‍ර මඟින් උපයන ආදායම ඉහළ නංවා ගැනීම හා ඒවා ඵලදායී ලෙස ආයෝජනය කිරීම අත්‍යවශ්‍ය වේ. ප්‍රාග්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් සම්පත් පරතරයක් පවත්නා හෙයින් සීමිත ආදායම, පුනරාවර්තන අයිතමයන් සඳහා පමණක් සීමා කිරීම පිළිබඳව පළාත් අධිකාරීන් නැවත වරක් සිතා බැලීම සිදු කළ යුතුව ඇත.

- **පළාත් මට්ටමේ සංවර්ධන විභවතා හඳුනාගැනීම -** පළාත් සංවර්ධනය සඳහා යොදාගත හැකි තම සම්පත් විභවතාවන් සෑම පළාතක්ම සතුව පවතී. සාපේක්ෂ වාසි පවත්නා මෙම විභවතාවයන් හඳුනාගත යුතු අතර, ඒවා එකතු කළ වටිනාකම හා ආදායම වැඩි වන අයුරින් උපයෝජනය කිරීම ඉතා වැදගත් වේ.

මෙම සංකල්පය ප්‍රායෝගික තලයට ගෙන ඒමේ අදහසින් මුදල් කොමිෂන් සභාව විසින් ආයෝජන මණ්ඩලය හා අදාල ජාතික හා පළාත් මට්ටමේ ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යෑමට අදහස් කර ඇත. මෙම තත්ත්වය තුළ ජාතික නිෂ්පාදිතයට පළාත්වලින් සිදුවන දායකත්වය තවදුරටත් ඉහළ නැංවෙන පරිදි ස්වකීය ආදායම් පදනම පුළුල් කරගැනීමේ අවස්ථා පිළිබඳව පළාත් අධිකාරීන් විසින් අවධානය යොමු කළ යුතු වේ. තවද, විකල්ප ආයෝජන ප්‍රභවයන් කෙරෙහි සැලකිලිමත් වීම අත්‍යවශ්‍ය සාධකයක් බව වටහා ගත යුතුව ඇත.

## 6.5පළාත් මට්ටමේ ආදායම් පදනම පුළුල් කිරීම

පවත්නා නීතිමය රාමුව තුළ පළාත්වලට ස්වකීය ආදායම් වැඩි කරගැනීමේ ඉඩ ප්‍රස්ථා පවත්නා අතර, පළාත් පාලන ආයතනවල ආදායම් ධාරිතාවය ඉහළ නැංවීම සඳහා උපකාරී වීම ද අත්‍යවශ්‍ය සාධකයක් වේ. පළාත් හා පළාත් පාලන මට්ටමෙන් වැඩි කර ගත හැකි ආදායම් බදු හා බදු නොවන ආදායම් ලෙස වර්ගීකරනය කළ හැකිය. ආදායම් ප්‍රවර්ධනය සඳහා භාවිතයට ගත හැකි ප්‍රධාන උපාය මාර්ග කිහිපයක් පහතින් විස්තර කර ඇත.

- දැනට පවත්නා තක්සේරුව යාවත්කාලීන වී නොමැති හෙයින් වත්කම් ක්‍රමවත් ලෙස තක්සේරු කිරීම මඟින් පළාත් පාලන ආයතනවල ආදායම් වැඩි කර ගැනීමේ විභවතාවයක් පවතී. ප්‍රායෝගිකව දක්නට ලැබෙන කරුණක් වනුයේ, ඇතැම් ආදායම් ලබා ගැනීම සඳහා දරනු ලබන පරිපාලන වියදම උපයනු ලබන ආදායමට වඩා වැඩි අගයක් ගන්නා බවයි. පළාත් පාලන ආයතන විසින් දැනට භාවිතා කරනු ලබන තක්සේරු ක්‍රමවේද යල්පැන ගිය ඒවා වන අතර, අවශ්‍ය කරන ශ්‍රම බලකාය නොමැති වීම ද තවත් ගැටළුවකි. මෙම තත්ත්වය තුළ පළාත් පාලන ආයතන විසින් පවත්නා නීතිමය ප්‍රතිපාදන තුළ තක්සේරු කිරීමේ කාර්යය සුදුසුකම් ඇති බාහිර පාර්ශවයක් මඟින් සිදු කිරීමේ ක්‍රමවේදය කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

- වත්කම් පැවරීමේ දී අය කරනු ලබන මුද්දර ගාස්තු සැබෑ වටිනාකම පදනම් කරගෙන සිදු නොකරන බව හෙළි වී ඇත. පළාත් ආදායම් නිලධාරීන් මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබුණේ වුවද, තවමත් නියමිත මුද්දර ගාස්තු පළාත්වලට නොලැබෙන බව නොරහසකි. එබැවින්, මහජනතාවට වත්කම්වල සැබෑ වටිනාකම මත මුද්දර ගාස්තු ගෙවීම් අවශ්‍යතාවය පිළිබඳව දැනුමක් ලබාදීම අවශ්‍ය කෙරේ.

- පළාත් මට්ටමෙන් ගත් විට නියමිත බදු නොගෙවා ක්‍රියාත්මක වන ආදායම් උපදවන ආයතන බහුලව දක්නට ලැබේ. මෙවැනි ස්ථාන ලෙස උපකාරක පංති, සෞඛ්‍ය සේවා සැපයුම් මධ්‍යස්ථාන, ආපනශාලා, රූපලාවන්‍ය ස්ථාන, ශාරීරික ව්‍යායාමවලට අදාල ස්ථාන හා සංචාරක කර්මාන්තයට අදාල ආයතන ආදිය දැක්විය හැකිය. මෙවැනි ආයතනවලින් ආදායම් උත්පාදනයට සහායක් ලබාගැනීම සඳහා පළාත් අධිකාරීන් ක්‍රියාශීලීව මැදිහත් විය යුතුය.

- පළාත් අධිකාරීන් විසින් ප්‍රාග්ධනය හා ආදායම බෙදා ගැනීමේ පදනම මත වාණිජමය වශයෙන් ලාභදායී ව්‍යාපාර විෂයෙහි පෞද්ගලික අංශයේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය.

- පළාත් පාලන ආයතනවලට විවිධ නීතිරීති හා රෙගුලාසි යටතේ ස්වකීය ආදායම එකතු කර ගැනීම සඳහා බලය පැවරී ඇත. කෙසේ වුවද, එක් එක් පළාත් පාලන ආයතනය තුළ පවත්නා විවිධ සමාජ-ආර්ථික තත්ත්වයන් නිසා එකතු කළ හැකි ආදායමේ විෂමතාවයන් දක්නට ලැබේ. සෑම පළාත් පාලන ආයතනයකම ආදායම් පදනම කුමක් වුවද, අවශ්‍ය කරනු ලබන සේවා සැපයුම් ලබා දීම සිදු කළ යුතුය. මෙවැනි පසුගාමී පළාත් පාලන ආයතනවලට අතිරේක මූල්‍යාධාර සැපයීමේ ක්‍රමවේදයක් දෙසට යොමු වී අත්‍යවශ්‍ය කරුණකි.

- රජය විසින් පළාත් සම්බන්ධයෙන් ආදායම් බෙදා ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමත් සමඟ ව්‍යාපාරික පිරිවැටුම් බද්ද අහෝසි විය. බදු ව්‍යුහය සරල කිරීමෙ අදහසින් ජාතිය ගොඩ නැගීමේ බද්ද ජාතික මට්ටමෙන් අය කර පළාත්වලට ප්‍රේෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දිමත් සමඟ පළාත් ආදායම් නිලධාරීන්ගේ කාර්යභාරය සීමා විය. මෙම තත්ත්වය තුළ එම නිලධාරීන් ප්‍රශස්ත අයුරින් සේවා නියුක්ත කිරීම සඳහා ඔවුන්ගේ සේවාව පළාත් පාලන මට්ටමේ ආදායම් ප්‍රවර්ධනය සඳහා යොදා ගත යුතු අතර, ඔවුන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඵලදායී ලෙස සහභාගී කරවා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත.

### 6.6ආයතනික ප්‍රතිඵල රාමු ප්‍රවේශය අනුගමනය කිරීම

මුදල් කොමිෂන් සභාව විසින් 2013 වර්ෂයේ දී පළාත් සඳහා ආයතනික ප්‍රතිඵල රාමු ප්‍රවේශය හඳුන්වා දෙන ලදී. ඒ අනුව, සියලුම පළාත් විසින් 2013 - 2017 කාල සීමාව ආවරණය වන පරිදි මධ්‍යකාලීන ආයතනික ප්‍රතිඵල රාමු සකස් කරන ලදී. මෙම මධ්‍ය කාලීන ප්‍රතිඵල රාමු පදනම් කරගෙන පළාත් විසින් 2013 හා 2014 යන වර්ෂ සඳහා වාර්ෂික සංවර්ධන සැලසුම් සකසන ලද අතර, ඒවා ක්‍රියාත්මක මට්ටමේ පවතී.

මෙම ක්‍රමවේදය යටතේ පළාත් විසින් එක් එක් ප්‍රමුඛ පරාසය සඳහා ප්‍රතිවිපාක සහ ප්‍රතිඵල හඳුනාගත යුතු අතර, ඒවා මැනීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක හඳුනා ගත යුතුය. මේ අනුව, සාම්ප්‍රදායිකව පැවති යෙදවුම් - නිමැවුම් සබඳතාවය වෙනුවට අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා සම්පත් යෙදවීම අපේක්ෂා කෙරේ. සියලුම පළාත් විසින් 2014 වර්ෂය සඳහා සංවර්ධන සැලසුම් සැකසීමේ දී ඉහත දැක් වූ මධ්‍ය කාලීන ආයතනික ප්‍රතිඵල රාමුව මත පදනම් වීම අනිවාර්ය විය. එමෙන්ම, රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවෙහි දැක්වෙන ප්‍රතිපත්ති හා උපාය මාර්ග මෙන්ම මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ සමග අනුගත වීම අනිවාර්ය වේ.

මෙයට අමතරව, අධීක්ෂණ හා මෙහෙයුම් ක්‍රියාවලිය ද මෙම නව ප්‍රවේශයට අනුව සිදු කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර මුදල් කොමිෂන් සභාව විසින් හඳුන්වා දුන් අතර, අවශ්‍ය උපදෙස් 2014 වර්ෂය සඳහා වූ මාගෝ්පදේශ මඟින් සපයා ඇත.

## 6.7සඵලදායී අධීක්ෂණ හා මෙහෙයුම් ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම

ආයතනික ප්‍රතිඵල රාමුවල හඳුනාගනු ලැබූ ප්‍රධාන කාර්ය සාධන දර්ශකවලට අනුව ආයෝජනවලින් ලද ප්‍රතිඵල කෙරෙහි බලධාරීන් අවධානය යොමු කිරීම සහතික කරනු වස් මුදල් කොමිෂන් සභාව විසින් 2013 වර්ෂයේ දී ප්‍රතිඵල පාදක අධීක්ෂණ හා මෙහෙයුම් ක්‍රමවේදය හඳුන්වාදීම සඳහා පියවර ගැනු ලැබීය.

මධ්‍යකාලීන ආයතනික ප්‍රතිඵල රාමුව පදනම් කරගෙන සකස් කරන ලද 2013 හා 2014 වර්ෂ සඳහා වූ වාර්ෂික සංවර්ධන සැලසුම් දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතී. මෙමඟින් මූලික වශයෙන් අපේක්ෂා කරනුයේ සාම්ප්‍රදායික ක්‍රමවේදයෙන් මිදී අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගත හැකි වන පරිදි සැලසුම් ක්‍රියාත්මක කිරීම සිදු කර තිබේද යන්න පිළිබඳව කිසියම් ක්‍රමවේදයකට අනුව අධීක්ෂණයට හා මෙහෙයුමට ලක් කිරීමයි. ජාතික ප්‍රතිපත්තියට අනුගත වීම පිළිබඳව ද මෙහිදී සැලකිල්ල යොමු කරනු ඇත.

## 6.8ආයතනික කාර්යභාරය හා වැඩ පරිමාව මත පදනම් වූ පළාත් කාර්ය මණ්ඩලය

විවිධ ආයතනවලට පවරන ලද සේවාවන් මනා ලෙස ඉටු කිරීමෙහි ලා කාර්ය මණ්ඩලය පිළිබඳ නිවැරදි තක්සේරුවක් අවශ්‍ය කෙරේ. එක් අතකින් ඵලදායී නොවන කාර්ය මණ්ඩලයක් සිටීම හා අනික් අතින් අයවැයට අනවශ්‍ය බරක් වීම වළක්වාලනු පිණිස කිසියම් ආයතනයක කාර්යභාරය හා සේවක අවශ්‍යතාවයන් මැනෙවින් තක්සේරු කළ යුතු වේ. එවිට අනවශ්‍ය කාර්ය මණ්ඩලය හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකි වනු ඇත. පළාත්වල ප්‍රාග්ධන කාර්ය මණ්ඩල අවශ්‍යතා තක්සේරු කිරීම පිණිස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව, අදාල ජාතික අමාත්‍යාංශ හා මුදල් කොමිෂන් සභාව විසින් ඒකාබද්ධ අභ්‍යාසයක් සිදු කරනු ලැබේ. ආයතනවල වැඩ පරිමාව හා පවරන ලද කාර්යයන් ඉටු කිරීමේ කාල රාමුව මෙහිදී සැලකිල්ලට ගැනේ.

## 7. නිගමනය

ප්‍රධාන සමාජ-ආර්ථික දර්ශකයන්ගේ උපනතිය පරික්ෂා කිරීමේ දී පසුගිය වසර කිහිපය තුළ පළාත් විසින් අත් කර ගනු ලැබූ සංවර්ධන ප්‍රතිඵල සැලකිය යුතු මට්ටමක පවතින බව පෙනී යයි. පසුගිය වසර පහක කාලය තුළ දළ දේශීය නිෂ්පාදිතය සඳහා වූ පළාත් දායකත්වය සැලකිය යුතු තරමින් වෙනස් වී ඇති අතර, බස්නාහිර පළාතේ දායකත්වය 45% සිට 43% දක්වා අඩු වීම තුළින් එයට සාක්ෂි සැපයේ. සහස්‍ර සංවර්ධන ඉලක්ක I පිළිබඳව සලකා බලන විට 2002 - 2010 කාල සීමාව තුළ සෑම පළාතකම දරිද්‍රතා අනුපාතය සැලකිය යුතු ලෙස අඩුවීමක් පෙන්නුම් කරයි. පහ ශිෂ්‍යත්ව විභාගය සමත් වීමේ අනුපාතය සහ අ.පො.ස. (සා/පෙළ) හා අ.පො.ස. (උ/පෙළ) විභාග ප්‍රතිඵල වැනි දර්ශක විෂයෙහි ගත් විට, පළාත් මට්ටමෙන් අධ්‍යාපනය සඳහා දරන ලද පිරිවැය ඵලදායී බව පෙනී යයි. පළාත් මට්ටමේ සෞඛ්‍ය දර්ශක දෙස බලන විට ද මෙවැනි ඵලදායී ප්‍රතිඵල අත්කර ගෙන තිබෙන බව පැහැදිලි වේ.

මාර්ග, විදුලිබල සැපයුම, නිවාස හා ජීවන වෘත්තීය කටයුතු පිළිබඳව බලන විට පෙනී යන්නේ උතුරු හා නැගෙනහිර පළාත් විසින් අත්කරගෙන තිබෙන ප්‍රගතිය විශිෂ්ට බවයි. රජය මඟින් පශ්චාද් යුද ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ මේ පළාත්වලට සංවර්ධන අරමුදල් සැපයීම අඛණ්ඩව සිදු කරනු ඇත.

මුළු වියදමෙන් 80% ක් පමණ වන පුනරාවර්තන වියදම ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ. එනම්, පුද්ගල පඩිනඩි හා අනෙකුත් පුනරාවර්තන වියදම් වශයෙනි. පළාත්වල පුනරාවර්තන වියදම සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින බවට මහජනතාව අතර මතයක් පවත්නා හෙයින් පුනරාවර්තන වියදම්වල ඵලදායිත්වය පිළිබඳ පිරික්සා බැලීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම අධ්‍යයනයට සෞඛ්‍ය, අධ්‍යාපන, මාර්ග, කෘෂිකර්මය, වාරිමාර්ග සහ සමාජ සේවා යන අංශ අයත් විය. අධ්‍යයනය මඟින් පැහැදිලි වූයේ, මෙම අංශ ලබා ඇති ප්‍රගතිය සමඟ බලන විට දරන ලද පුනරාවර්තන වියදම් ඵලදායී වූ බවයි. මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වනුයේ, ජාතික මට්ටමේ අමාත්‍යාංශ හා ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා අවශ්‍ය කරනු ලබන මිනිස් බලය (විශේෂයෙන් අධ්‍යාපන හා සෞඛ්‍ය යන අංශවල) සැපයීමේ දී පළාත් විසින් විශාල දායකත්වයක් සපයා ඇති බවයි. තවද, ජාතික මට්ටමෙන් සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ අත්කර ගැනීම සඳහා පළාත්වලින් විශේෂ දායකත්වයක් සිදු වූ බව ද මෙහිලා සඳහන් කළ යුතුය. එයට හේතුව, ඊට අදාල ජාතික මට්ටමේ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පළාත් කාර්ය මණ්ඩලයේ සහයෝගය ලබා දීමයි.

පළාත් සංවර්ධන වැඩසටහන්වලින් හිතකර ප්‍රතිඵල ලබාගැනීම සඳහා භාවිතයට ගත හැකි යෝජනා රාශියක් 2014 අයවැය කථාව මඟින් ඉදිරිපත් කර ඇත. මෙම යෝජනා කෘෂිකර්මය, වාරිමාර්ග, ධීවර, පශු සම්පත්, ග්‍රාමීය සංවර්ධනය, කුඩා කර්මාන්ත, සෞඛ්‍ය, අධ්‍යාපන හා පළාත් පාලනය යන අංශවලට අයත් වේ. උප ජාතික මට්ටමේ ව්‍යාපෘති හා වැඩසටහන් සැකසීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී මෙම යෝජනා ඵලදායී ලෙස යොදා ගැනීම සඳහාත්, ද්විකරණය වළක්වා ගැනීම සඳහාත් පළාත් හා පළාත් පාලන ආයතන හා ජාතික මට්ටමේ ආයතන සමග සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.

ආරියරත්න හේවගේ
පත් කළ සාමාජික හා සභාපති

පී.බී.ජයසුන්දර
නිලබලයෙන් සාමාජික

අජිත් නිවාර්ඩ් කබ්රාල්
නිලබලයෙන් සාමාජික

එම්.එන්.ජුනයිද්
පත් කළ සාමාජික

සී.පී.ඊ. ගුණසිංහම්
පත් කළ සාමාජික

*ඇමුණුම 1*

**සාමූහික ප්‍රදාන වෙන් කිරීම සහ නිදහස් කිරීම 2009 – 2013**

*රු.මි.*

| පළාත | 2009 | | 2010 | | 2011 | | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කිරීම | නිදහස් කිරීම | වෙන් කිරීම | නිදහස් කිරීම | වෙන් කිරීම | නිදහස් කිරීම | වෙන් කිරීම | නිදහස් කිරීම | වෙන් කිරීම | නිදහස් කිරීම 2013.06.30 දක්වා |
| බස්නාහිර | 1,923 | 2,749 | 6,100 | 6,100 | 7,170 | 8,979 | 9,011.25 | 8,893.77 | 8,501.76 | 3,250 |
| මධ්‍යම | 12,176 | 12,487 | 13,000 | 13,000 | 13,270 | 13,697 | 13,762.75 | 13,048.62 | 14,863.83 | 5,887 |
| දකුණු | 10,298 | 10,085 | 10,500 | 10,500 | 11,172 | 11,760 | 11,802.99 | 11,906.59 | 12,908.47 | 5,459 |
| උතුරු | 8,349 | 7,963 | 8,400 | 8,700 | 9,153 | 9,318 | 8,556.79 | 8,500.30 | 10,075.30 | 4,261 |
| නැගෙන හිර | 9,891 | 9,421 | 10,100 | 10,100 | 10,473 | 10,952 | 11,385.07 | 10,737.26 | 11,635.26 | 4,671 |
| වයඹ | 12,294 | 11,868 | 12,300 | 12,299 | 12,656 | 13,018 | 12,651.07 | 11,920.59 | 14,118.11 | 5,720 |
| උතුරු මැද | 6,270 | 6,513 | 7,300 | 7,300 | 7,386 | 7,596 | 7,005.42 | 6,776.02 | 7,345.62 | 3,031 |
| ඌව | 7,907 | 7,807 | 8,300 | 8,300 | 8,897 | 8,948 | 9,458.83 | 9,031.70 | 10,263.21 | 4,274 |
| සබරගමුව | 8,893 | 8,493 | 9,000 | 9,000 | 9,823 | 10,335 | 11,243.32 | 10,736.94 | 13,088.46 | 4,978 |
| **එකතුව** | **77,999** | **77,386** | **85,000** | **85,299** | **90,000** | **94,602** | **94,877.48** | **91,551.79** | **102,800.00** | **41,531.00** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව හා මහා භාණ්ඩාගාරය*

*ඇමුණුම 2*

**උපමාන පාදක ප්‍රදාන වෙන් කිරීම සහ නිදහස් කිරීම 2009 – 2013**

*රු.මි.*

| පළාත | 2009 | | 2010 | | 2011 | | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කිරීම | නිදහස් කිරීම | වෙන් කිරීම | නිදහස් කිරීම | වෙන් කිරීම | නිදහස් කිරීම | වෙන් කිරීම | නිදහස් කිරීම | වෙන් කිරීම | නිදහස් කිරීම 2013.06.30 දක්වා |
| බස්නාහිර | 510 | 375 | 450 | 383 | 400 | 660 | 427 | 180.41 | 370 | 370 |
| මධ්‍යම | 446 | 306 | 410 | 308 | 375 | 337 | 400 | 218.40 | 321 | 160.5 |
| දකුණු | 426 | 230 | 350 | 298 | 325 | 292 | 347 | 189.46 | 295 | 147.5 |
| උතුරු | 332 | 241 | 300 | 255 | 275 | 247 | 294 | 160.52 | 195 | 97.5 |
| නැගෙනහි ර | 382 | 197 | 325 | 276 | 250 | 230 | 267 | 145.78 | 217 | 108.5 |
| වයඹ | 370 | 272 | 300 | 255 | 300 | 270 | 320 | 174.72 | 270 | 135 |
| උතුරු මැද | 297 | 137 | 260 | 260 | 275 | 1,277 | *1,616.63 | 1420.0 | *1,005 | 742 |
| ඌව | 373 | 206 | 300 | 255 | 300 | 240 | 320 | 174.72 | 240 | 120 |
| සබරගමුව | 416 | 311 | 380 | 323 | 335 | 301 | 357 | 194.92 | 252 | 126 |
| **එකතුව** | **3,550** | **2,276** | **3,075** | **2,612** | **2,835** | **3,855** | **4,348.63** | **2,858.93** | **3,165** | **2,007** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව හා මහා භාණ්ඩාගාරය*

**පරිපූරක වෙන් කිරීම් සමග*

*ඇමුණුම 3*

**පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් කිරීම සහ නිදහස් කිරීම 2009 – 2013**

*රු.මි.*

| පළාත | 2009 | | 2010 | | 2011 | | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වෙන් කිරීම | නිදහස් කිරීම | වෙන් කිරීම | නිදහස් කිරීම | වෙන් කිරීම | නිදහස් කිරීම | වෙන් කිරීම | නිදහස් කිරීම | වෙන් කිරීම | නිදහස් කිරීම 2013.06.30 දක්වා |
| බස්නාහිර | 1,726 | 1,567 | 1,755 | 1,737 | 1,736 | 1,380 | 1,990 | 491 | 1,701 | 990 |
| මධ්‍යම | 2,572 | 1,606 | 2,145 | 1,895 | 2,490 | 1,369 | 3,013 | 856.88 | 3,254 | 797.27 |
| දකුණු | 1,727 | 1,102 | 1,773 | 1,656 | 1,535 | 1,283 | 1,818 | 813.85 | 1,634 | 555.83 |
| උතුරු | 1,877 | 1,946 | 2,807 | 2,365 | 3,068 | 1,306 | 3,568 | 947.37 | 3,692.7 | 518.46 |
| නැගෙනහිර | 4,702 | 1,202 | 3,273 | 1,730 | 5,079 | 1,135 | 3,917 | 1,108.25 | 4,915 | 725.8 |
| වයඹ | 1,530 | 1,056 | 1,633 | 1,613 | 1,542 | 1,265 | 1,836 | 816.85 | 1,867 | 478 |
| උතුරු මැද | 1,701 | 1,202 | 2,350 | 1,956 | 2,808 | 1,141 | 2,806.5 | 717.72 | 2,139.5 | 534 |
| ඌව | 2,338 | 1,173 | 2,007 | 1,888 | 3,169 | 1,210 | 3,117 | 805.81 | 2,596 | 769.82 |
| සබරගමුව | 2,259 | 1,143 | 1,737 | 1,564 | 2,028 | 1,110 | 2,648 | 709.66 | 2,765 | 652.1 |
| **එකතුව** | **20,431** | **11,998** | **19,480** | **16,403** | **23,455** | **11,199** | **24,713.5** | **7,267.39** | **24,564.2** | **6,021.28** |

*මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව හා මහා භාණ්ඩාගාරය*

*සටහන: සංවර්ධන ව්‍යාපෘති ඇතුළත්ව*